# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2289/31 – 2022 ජූලි 20 වැනි බදාදා – 2022.07.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2017/194.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරිය**

131 වන අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2018.07.04 දිනැති හා අංක 2078/33 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2018.06.25 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් මහනුවර, යටිහලගල, අංක 109 හි පදිංචි ජී. ජී. නිමල් රණතුංග මයා, සහ 2. කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.03.27 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 ජූනි මස 17 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

1A – G 37107 – 11 (2022/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

යොමු අංකය: IR/COM/04/2017/194.

**කොළඹ කාර්මික අධිකරණයේ දී ය**

1. ජී. ජී. නිමල් රණතුංග මයා,
අංක 109, යටිහලගල,
මහනුවර,

*පළමුවැනි පාර්ශ්වය.*

*නඩු අංකය*: A/43/2018

*සහ,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200, කිරුළ පාර,
කොළඹ 05.

*දෙවැනි පාර්ශ්වය.*

අතර පවතින ආරවුල.

**ප්‍රදානය**

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය, ගරු රවින්ද්‍ර සමරවීර මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ව උක්ත ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා 2018.06.25 දිනැති නියෝගයෙන් බේරුම්කරු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකර ඇත.

*ආරාවුලට තුඩු දුන් කාරණය :*

බේරුම්කරණය සඳහා මා වෙත යොමුකර ඇති උක්ත නියෝගය ප්‍රකාරව ඉහත සඳහන් දෙපාර්ශ්වය අතර උද්ගතවී ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කාරණය ලෙස කම්කරු කොමසාරිස් ඒ. විමලවීර මහතා විසින් 2018 ජුනි මස 22 වන දිනැතිව එවා ඇති ලිපියේ දැක්වෙන්නේ,

"ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රාදේශීය අභ්‍යන්තර ගිණුම් පරීක්ෂක ලෙස කටයුතු කළ ජී. ජී. නිමල් රණතුංග මහතා වෙත ඉදිරිපත් කරන ලද ශ්‍රී ලංගම/මාසක/විනය/117/39/2012 හා 2012.07.13 දින දරන චෝදනා පත්‍රය යටතේ ඔහුට විරුද්ධව පැවති විනය පරීක්ෂණයේදී ලබාදී ඇති විනය නියේගය / අභියාචන නියෝගය මඟින් අසාධාරණයක් සිදුව තිබේද යන්න සහ එසේ අසාධාරණයක් සිදුව තිබේනම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ.

*පසුබිම් සහ නඩු කර්ය පරිපාටිය :*

ඉල්ලුම්කාර පාර්ශ්වය විසින් තම පළමු ප්‍රකාශය 2018.08.01 වැනි දින ගොනුකර ඇති අතර, එකී ප්‍රකාශය මගින් කර ඇත්තේ තමන්ට 1997 ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට පත්වීමක් ලද බවත්, ඉන්පසු සේවයේ ස්ථිර කිරීම්, උසස්වීම් සහ ස්ථාන මාරුවීම් ලැබීම් පිළිබඳවත් ය. ( ඉ. 1 සිට 4 දක්වා ලේඛන සලකුණු කරමින් මෙම කරුණු වඩාත් තහවුරු කර ඇත.)

මේ හැර 2012.07.13 දිනැති මෙම නඩුවට අදල චෝදනා පත්‍රය තමන් වෙත ලැබී ඇති බවත්, එහි තමන්ගේ සේවා ස්ථානය සහ තනතුර වැරදි ලෙස සටහන්කර ඇති බවත්, තමන් එකී චෝදනා පත්‍රයට පිළිතුරු යැවුවද එය පිළිගන්නා හෝ නොපිළිගන්නා බව නොදන්වා විභාගයක් පැවැත්වූ බවත්, චෝදනා පත්‍රයේ චෝදනා සනාථ කිරීමට ඇතුලත් කළ චෝදනා ගණන 38 ක් වූවත් විනය විභාගයේදී ලේඛන 45ක් ඉදිරිපත්කර ඇති බවත්, ලේඛන 07ක් සම්බන්ධයෙන් චෝදනා පත්‍රයෙන් තමා දැනුවත් කර නොතිබූ බවත් ප්‍රකාශනයේ සඳහන් කර ඇත. මෙම කරුණුවලට අදලව ඉ4, ඉ5, ඉ5-1, ඉ 5-2, ඉ 6 යන ලේඛනද ගොනුකර ඇත.

තවද මෙම පරීක්ෂණයේ පැමිණිල්ලට අදළ මූලික ලේඛනය පැ.1 ලෙස සලකුණු කර තිබුණද, එකී ලේඛනය විනය විභාගයේදී තහවුරු කිරීමට පැමිණිල්ල අසමත්ව ඇති බවද කියා සිටී, මීට අමතරව මෙම සිද්ධියට අදල මූලික පැමිණිල්ල සම්බන්ධයෙන් පරීක්‍ෂණයේ අවසානය දක්වාම සිරිල් රංජිත් පතිරණ යන අය ඒ සම්බන්ධයෙන් වැරදිකරු ලෙස සඳහන් කලද, ඔහු චූදිතයකු ලෙස විනය විභාගයට ඇතුලත්කර නොමැති බව කියා සිටී, ඒ අනුව මෙම සිද්ධියට වගකිවයුතු ඉහල නිලධාරියා ඉවත්කර පැමිණිලිකරුට දඩුවම් දීමෙන් විනය විභාගය යුක්ති සහගත සහ සාධාරණ නොවන බවද ප්‍රකාශ කර ඇත. මේ හැර ඉල්ලුම්කරු වැඩි දුරටත් ප්‍රකාශ කර සිටින්නේ විනය විභාගයේදී විත්තිය හරස් ප්‍රශ්ණ සඳහා භාජනය නොකිරීම, විගණන සාකච්ඡා සඳහා ශාලා වෙන් කිරීමේ පිළිවෙත විනය විභාගයේදී හෙළි නොකිරීම, බිල්පත තමා සකස් නොකළ බවත්, එයට අදලව මුදලක් තමන් වංචා කලේ නම් එය කොතෙක්ද යන්න පරීක්ෂණයේදී හෙළි නොකිරීම, ගෙවීම් නිලධාරි හෝ වැය සහතික කල නිලධාරි විනය විභාගය සඳහා නොගෙන්වීම් යනාදී කරුණු මත විනය පරීක්ෂණය සාධාරණ නොවන බවයි.

වග උත්තරකාර පාර්ශ්වය විසින් 2018.08.14 දින තම පළමු ප්‍රකාශය ඉදිරිපත්කර ඇති අතර, එහි 01 සිට 09 දක්වා කරුණු තුලින් ඉල්ලුම්කරුගේ පත්වීම, ස්ථිර කිරීම, උසස්වීම්, ස්ථාන මාරුකිරීම්, සේවා තත්වයන් ආදිය පිළිගෙන ඇති අතර ඒ පිළිබඳව හබ කිරීමක්ද නොකරයි.

ප්‍රකාශයේ 10 වැනි කරුණෙන් දක්වා ඇත්තේ ඉල්ලුම්කරුගේ විෂමාචාර ක්‍රියා හේතුවෙන් 2012.07.13 දිනැති චෝදනා පත්‍රය නිකුත් කල බවත්, එයට අනුව ඉල්ලුම්කරු මණ්ඩලීය පිළිවෙත් අනුගමනය නොකර අභිමතය පරිදි නිවහන ඩිලුක්ස් ආයතනය සම්මන්ත්‍රණයක් සඳහා තෝරාගෙන ඇති බවත්, නිවහන ඩිලුක්ස් ආයතනයෙන් නිකුත් කරන ලද, අංකඃ 1068 දරණ ව්‍යාජ බිල්පත සැකසීමට ඍජුව හෝ වක්‍රව දයක වී ඇති බවත්, අභ්‍යන්තර ගිණුම් පරීක්ෂක සිරිල් රංජිත් පතිරණ යන අය නිවහන ඩිලුක්ස් ආයතනය පරිහරණය කර සිදුකර ඇති මුදල් වංචාවට ඉල්ලුම්කරු ආධාර අනුබල දී ඇති බවත්, ප්‍රධාන අභ්‍යන්තර ගිණුම් පරීක්ෂක විසින් කරන ලද ක්‍රියාවන් දන දනම මුදල් වංචා සහගතව ලබා ගැනීමට කටයුතු කර ඇති බවත්, එකී චෝදනා තුලින් තනතුරට සුදුසු නොවන පුද්ගලයකු බවටත් චෝදනා කර ඇත.

මෙම චෝදනාවන්ට අදළව පැවැත්වූ විනය පරීක්ෂණය මත ඉල්ලුම්කරු සියලු චෝදනාවන්ට වරදකරු වී ඇති බැවින් මසක් තුළ අභියාචනා කිරීමේ අයිතියට යටත්ව සේවයෙන් පහකර ඇති අතර ඉන්පසු කරන ලද අභියාචනය සලකා බලා මුල් නියෝගය සංශෝධනය කර ඉල්ලුම්කරු V ශ්‍රේණියට පහත හෙලා 2013.11.01 සිට එකී ශ්‍රේණියේ ආරම්භක වැටුප් තලයේ තබා මාවනැල්ල ඩිපෝවට ස්ථාන මාරුකළ බවත් ප්‍රකාශකර ඇත. පසුව ඉල්ලුම්කරුගේ ඉල්ලීම මත ඔහු නුවරඑළිය ප්‍රාදේශීය පාලන කාර්යාලය වෙත මාරු කර උසාවි නිලධාරි තනතුරේ කාර්යයන් පවරා ඇති බවත් ඉලලුම්කරුට සාධාරණ සහ යුක්ති සහගත ලෙස කටයුතු කර ඇති බවත් ප්‍රකාශ කර ඇත.

වග උත්තරකරුගේ 2018.08.14 දිනැති ප්‍රකාශ සම්බන්ධයෙන් ඉල්ලුම්කරු විසින් 2018 සැප්තම්බර් 12 දින සිය ප්‍රති පිළිතුරු ප්‍රකාශය ගොනුකර ඇති අතර, එහිදී 1 සහ 2 කරුණු යටතේ නඩු අංකය සහ vii ශ්‍රේණියට තමන් පත්වූ දිනය වග උත්තර කරු විසින් වැරදියට සටහන් කර ඇති බව ප්‍රකාශ කර එය නිවැරදි කර ඇති අතර වග උත්තරකරුගේ ප්‍රකාශයේ සඳහන් 02 සිට 09 දක්වා කරුණු පිළිගෙන ඇත. ඉල්ලුම්කරුගේ ප්‍රති පිළිතුරු ප්‍රකාශයේ 11, 12 කරුණු යටතේ වග උත්තරකරුගේ පිළිතුරු ප්‍රකාශයේ 10 කරුණ යටතේ සඳහන් කරුණු සම්බන්ධයෙන් ඉල්ලුම්කරු විරෝධතා ඉදිරිපත් කර ඇති අතර, වග උත්තරකරුගේ පිළිතුරු ප්‍රකාශයේ 11 කරුණ යටතේ දක්වා ඇති චෝදනා පත්‍රයේ අංකය, සහ වාක්‍ය ඛණ්ඩයන්හි දෝෂ පෙන්වා දී ඇත.

මේ හැර 12 කරුණ යටතේ වග උත්තරකරුගේ 10 කරුණ යටතේ සඳහන් චෝදනා පිළිබඳව විරෝධතා දක්වා ඇත. එහිදී දක්වා ඇත්තේ විගණන සාකච්ඡා සඳහා සම්මන්ත්‍රණ ශාලා තෝරා ගැනීමේදී මිල ගණන් කැඳවීමේ මණ්ඩලීය පිළිවෙතක් නොමැති බවත්, එවැනි තෝරාගත් ආයතන සඳහා මුදල් ගෙවීමක් නොකරන බවත්, එසේවූවද 2011. 10. 28 තෝරාගත් ආයතනය සම්බන්ධයෙන් මුදල් ගෙවා ඇති අතර ගෙවීමට අනුමැතිය දුන් නිලධාරියාට චෝදනා නොකර තමන්ට ද්වේශ සහගතව චෝදනා කර ඇති බවයි. තවද 1068 බිල්පතේ ලියා ඇති කරුණුවලට තමන්ගේ කිසිදු සම්බන්ධටක් නොමැති බැවින් ඒ සම්බන්ධයෙන් තමන්ට කරන ලද චෝදනාවද ද්වේශ සහගතව කරන ලද්දක් බවත්, මෙම පැමිණිල්ලට අදළ මුදල් වංචාව සඳහා ආධාර අනුබලදීම යන චෝදනාව තමා පිළි නොගන්නා බවත්, ගෙවීම් කල තැනැත්තා සහ මුදල් ලැබූ තැනැත්තා තමා නොවන බැවින් එකී චෝදනාවද පිළි නොගන්නා බවත්, චෝදනා පත්‍රයේ සඳහන් මුදල් වංචාවක් කිරීමට ආධාරයක් වන පරිදි කටයුතු කිරීම, තනතුරට සුදුසු නොවන පුද්ගලයකු සේ කටයුතු කිරීම යන චෝදනා ද ප්‍රතික්ෂේප පිළිනොගන්නා බවට ප්‍රකාශ කර ඇත. ඉල්ලුම්කරු වැඩි දුරටත් ප්‍රකාශ කර ඇත්තේ විනය විභාගයේදී සාක්ෂිකරුවන්ගෙන් හරස් ප්‍රශ්ණ ඇසීමට අවස්ථාවක් ලබා නොදීමෙන්ද විනය විභාගය යුක්ති සහගතව සහ සාධාරණව නොපැවති බවටද අභියාචනා විභාගයේදී ද තමන්ට යුක්තිය සහ සාධාරණය ඉටු නොවූ බවට කරුණු දක්වා ඇත.

වගඋත්තරකරුගේ දෙවන ප්‍රකාශය තුළින් ඉල්ලුම්කරුගේ පළමු ප්‍රකාශයේ 1 සිට 4 දක්වා කරුණු පිළිගෙන ඇති අතර චෝදනා පත්‍රයේ නගා ඇති චෝදනාවන් වන මිල ගණන් නොකැඳවා අභිමතය පරිදි "නිවහන ඩිලුක්ස්" ආයතනය තෝරා ගැනීම, එකී ආයතනයට ඉදිරිපත් කරන ලද අංක : 1068 දරන ව්‍යාජ බිල්පත සැකසීමට සෘජුව හෝ වක්‍රව දයකවීම, අභ්‍යන්තර ගිණුම් පරික්ෂක විසින් රාජ්‍ය මුදල් වංචා කිරීමේ නියැලී සිටි ක්‍රියාදාමයට ඉල්ලුම්කරු ආධාර අනුබල දීම, දූන දූනම මුදල් වංචා සහගතව ලබාගැනීමට ආධාර වන අයුරු කටයුතු කිරීම, තනතුරට නොගැලපෙන අයුරින් කටයුතු කිරීම යන චෝදනාවන් ඉල්ලුම්කරුට විරුද්ධව වග උත්තරකරු විසින් කර ඇති බවද පිළිගෙන ඇත. තවද ඉල්ලුම්කරුට එරෙහිව සාධාරණ විනය පරීක්ෂණයක් පැවැත්වූ බවද එහිදී ඉල්ලුම්කරු සේවයෙන් පහකළ බවත්, ඒ සඳහා ඉල්ලුම්කරු අභියාචනා කල අතර, ඒ අනුව ද විනය නියෝගය සංශෝධනය කරමින් ඔහු නැවත සේවයේ පිහිටවූ බවද, ඒ අනුව ඉල්ලුම්කරුට යුක්ති සහගත ලෙස කටයුතුකර ඇති බවද ප්‍රකාශ කර ඇත.

මෙලෙස දෙපාර්ශ්වයේම ප්‍රකාශයන් ලබා ගැනීමෙන් අනතුරුව, පැමිණිල්ල පිළිබඳව සමථයක්ද නොවූ හෙයින් නඩුව විභාගයට ගෙන දෙපාර්ශ්වයේම සාක්ෂි කැඳවා ඉන්පසු දෙපාර්ශ්වයේම ලිඛිත සැලකිරීම්ද ලබාගැනීමෙන් පසු ඉහත කී සියලුම පියවරයන්ට අදාළ කරුණු සලකා බලා නියෝගය ලබාදීමට කටයුතු කර ඇත.

*නඩු විභාගය සහ සාක්ෂි සම්පිණ්ඩනය :-*

මෙම නඩුවේ දෙපාර්ශ්වය අතර සමථයක් ඇති නොවූයෙන් මෙම නඩුව 2018.10.18 දින විභාගයට ගන්නා ලදී. ඉල්ලුම්කාර පාර්ශ්වය සිය නඩුව ආරම්භ කල අතර, ඉල්ලුම්කරුගෙන් මූලික සාක්ෂි විමසීම මෙදින සිදුවිය. මෙහිදී පළමුවෙන්ම ඉල්ලුම්කාර පාර්ශ්වය විසින් A 1 සිට A 12F දක්වා ලේඛන ලකුණු කරමින් සාක්ෂි ලබා දෙමින් තමන්ට සිදුවූ අගතිය සම්බන්ධයෙන් කම්කරු දෙපාර්තමේන්තුවට කළ පැමිණිල්ල A 1 වශයෙන්ද තමන්ගේ පත්වීම, මාරුවීම් උසස්වීම් ආදියට අදාළ ලේඛන A2 සිට A8 දක්වා සලකුණු කර ඉදිරිපත් කරමින් තමන්ගේ සේවා තත්වය පිළිබඳව සවිස්තරව සාක්ෂි ලබාදී ඇත. ඉල්ලුම්කරු 2012.01.01 වන විට මහනුවර ප්‍රාදේශිකයේ අභ්‍යන්තර ගිණුම් පරීක්ෂක ලෙස උසස්වීමක් ලද බවත්, 2012 ජූලි මස වනවිට මහනුවර ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ අභ්‍යන්තර ගිණුම් පරීක්ෂක ලෙස සේවය කල බවත් එසේ සේවය කරන අතරතුර චෝදනා පත්‍රයක් ලැබුණු බවත්, එකී චෝදනා පත්‍රය A9 ලෙස ඉදිරිපත්කර සාක්ෂි දී ඇති අතර එහි චෝදනා 05ක් බවද සඳහන්කර සිටී. සාක්ෂිකරු වැඩි දුරටත් ප්‍රකාශ කර ඇත්තේ තමන්ට ලැබුණු චෝදනාව සම්බන්ධයෙන් A10 ලේඛනය මඟින් 2012.07.24 දිනැතිව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී පාලන වෙත අභියාචනා කළ බවයි. තවද එම චෝදනා සම්බන්ධ විභාග ගොනුවද, A15 ලෙස සලකුණු කර සිටින අතර එකී විභාග සඳහා තමන් නොකඩවා සහභාගී වූ බවද ප්‍රකාශ කර සිටී. තවද පැමිණිලි විභාගයේදී සිරිල් රංජිත් යන අය සාක්ෂි දී ඇති අතර ඔහු මුදලක් වංචා කලේද යන්න සඳහන් නොවූවත් තමන් ඔහුට වංචා කිරීමට ආධාර අනුබල දුන් බව සඳහන් වන බව ප්‍රකාශ කර ඇත.

තමන්ට කර ඇති A 9 C චෝදනා පත්‍රයේ පළමු චෝදනාව සම්බන්ධයෙන් පැමිණිලිකරු සාක්ෂි ලබාදී ඇති අතර ඔහු කියා සිටින්නේ ගබඩාවට භාණ්ඩ මිලදී ගැනීම සම්බන්ධයෙන් ආයතනය තුළ මිල ගණන් කැඳවීමක් තිබුණද විගණන සාකච්ජා සඳහා මිල ගණන් කැඳවීමේ පිළිවෙතක් නොවූ බවත්, විනය විභාගයේදීද එවන් පිළිවෙතක් තිබූ බවට වක්‍ර ලේඛයක් හෝ ඉදිරිපත් කර නොමැති බව අනුව පවසමින් තමන්ට එල්ලවූ චෝදනාව අභියෝගයට ලක්කර ඇත. ( සාක්ෂි පිටු අංකඃ22)

මේ තවද එකී ආයතනය තෝරා ගැනීම ප්‍රධාන විගණන පරීක්ෂකගේ නියමය අනුව සිදුවූ අතර තමාගේ මීට සම්බන්ධයක් නොමැති බවින් A 11 හි සඳහන් අංකඃ 1 යටතේ චෝදනාව වන මණ්ඩලීය පිළිවෙත් අනුව මිල ගණන් නොකැඳවා අභිමතය පරිදි විගණන සාකච්ඡාව සඳහා "නිවහන ඩිලුක්ස්" ආයතනය තෝරා ගැනීම තමන් පිළි නොගන්නා බව ප්‍රකාශ කර ඇත.

9AC හි දෙවන චෝදනාව වන "නිවහන ඩිලුක්ස්" ආයතනය විගණන සාකච්ඡාව සඳහා පාවිච්චි කිරීමට අදාළ බිල්පත් සැකසීම ඉල්ලුම්කරු විසින් සිදුකිරීමට ඉල්ලුම්කරු සෘජුව හෝ වක්‍රව දායක වූ බවට කරන චෝදනාව ඉල්ලුම්කරු විසින් ප්‍රතික්ෂේප කරමින් සාක්ෂි දී ඇත. එකී බිල්පත A 12 ලෙස ලකුණු කර සාක්ෂි දී ඇති අතර එකී බිල්පත වෙනත් අයෙකු විසින් පිළියෙළ කළ බවත් වැයපත ලිවීමේ වගකීම තමන් භාර ගන්නා බවටත් ඉල්ලුම්කරු විසින් සාක්ෂි දී ඇත. අංකඃ1068 බිල් පත්‍රය ඩිපෝ කළමනාකරුට ලබාදී ඇති බවටත් එයට සම්මන්ත්‍රණයට සහභාගී වූවන්ගේ නාම ලේඛනය අමුණා ඇති අතර එය A 13 ලෙස ලකුණු කර සිටී. එකී බිල්පත ව්‍යාජ බිල්පතක් බවට විමර්ෂණ නිලධාරියා කියා සිටියද වෙනත් කිසිවෙකු හෝ එලෙස ව්‍යාජ බිල්පතක් බවට සාක්ෂි දී නොමැති බවද සාක්ෂිකරු විසින් ප්‍රකාශ කර සිටී. තවද A12 වවුචරයේ වැය සහතික කිරීම ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ අභ්‍යන්තර ගිණුම් පරීක්ෂක, නුවරඑළිය ඩිපෝ කළමනාකාර තැන, නුවරඑළිය ප්‍රාදේශීය කළමනාකාර තැන, නුවරඑළිය සහකාර මුදල් කළමනාකාර තැන, යන අය විසින් "එය ගෙවීම් රෙගුලාසි අනුව සාධාරණ සහ යුක්ති සහගත බව සහතික කරමි." යනුවෙන් සහතික කර ඇති බවටත් ප්‍රකාශ කර සිටී. මෙම වච්චරයට අදාළ මුදල් රුඃ70775 ක් වන අතර එය අංකඃ 901634 චෙක්පත මගින් සහකාර කළමනාකාර මුදල් විසින් ගෙවා ඇති බවත්, මේ අනුව මෙකී චෙක්පත ව්‍යාජ චෙක්පතක් බවට සාක්ෂි නොමැති බවත් ප්‍රකාශ කර ඇත.

වැඩිදුර මූලික සාක්ෂි විමසීම 2018.10.18 දින සිදුවූ අතර එහිදී ඉල්ලුම්කරු ප්‍රකාශ කර ඇත්තේ ගෙවීම් නිත්‍යානුකුල නොවන්නේ නම් වැය සහතික කරන නිළධාරියා ඒ පිළිබඳව ක්‍රියා කළ යුතු බවයි. ගෙවීම් නිත්‍යානුකුල වන්නේ වැය සහතික කරන නිලධාරියා අත්සන් කිරීමෙන් පසුව බවද, වැඩි දුරටත් ප්‍රකාශ කර ඇත. ඒ අනුව තමන්ට ඒ පිළිබඳ වගකීමක් නොමැති බවද වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

චෝදනා පත්‍රයේ තෙවැනි චෝදනාව වන මුදල් වංචා කිරීම හෝ වංචා කිරීමට අනුබලදීම යන චෝදනාව තමන් පිළිනොගන්නා බවටද ඉල්ලුම්කරු සිය සාක්ෂියේදී වැඩි දුරටත් ප්‍රකාශ කර ඇත. වවුචරයක් සකස් කර දුන් පසු මුදල් ගෙවීම සම්බන්ධයෙන් තමාගේ කිසිදු වගකීමක් නොමැති බව ඉල්ලුම්කරු වැඩි දුරටත් ප්‍රකාශ කර ඇත.

තවද තමන් සලකුණු කළ A13 ලේඛනයේ සම්මන්ත්‍රණයට සහභාගී වූ අයගේ අත්සන් සංඛ්‍යාව 53ක් ලෙස සඳහන් වුවද, සැපයූ කෑම ප්‍රමාණය 69 ක් ලෙස සඳහන් කිරීමට හේතු වශයෙන් ඉල්ලුම්කරු සිය සාක්ෂියේදී ප්‍රකාශකර ඇත්තේ නිලධාරීන් මෙන්ම ඔවුන් සමග පැමිණි රියදුරන්, කාර්යාල කාර්‍ය සහායකයින් වැනි අනෙකුත් සේවාවල යෙදෙන්නන් සඳහාද ආහාර සැපයීමට සිදුවූ බැවින් සම්මන්ත්‍රණයට පැමිණි සංඛ්‍යාවට වඩා ආහාර සැපයීමට සිදුවූ බවයි. (පිටුව 17) මේ හැර බිල්පතේ සඳහන් නොවූවත් "සංග්‍රහ වියදම් සහ නවාතැන්" යන කොටස තමන් විසින් ඇතුලත් කළ බවත් සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත. ප්‍රාදේශීය අභ්‍යන්තර ගිණුම් පරීක්ෂක ඇතුළු පිරිසක් ඩිලුක්ස් ආයතනයේ නවාතැන්ගෙන සිටි හෙයින් එකී වියදමද බිල්පතට ඇතුළත් කිරීමට සිදුවූ බවට තමන්ට ඩිලුක්ස් ආයතනයෙන් විමසීමේදී දැනගැනීමට ලැබුණු හෙයින් වැය සහතික කරන නිලධාරීන් ගේ අවධානය පිණිස එලෙස "සංග්‍රහ වියදම් සහ නවාතැන්" යන කොටස එසේ ඇතුළත් කළ බවත් සාක්ෂිකරු වැඩි දුරටත් ප්‍රකාශ කර ඇත. තමන් වැය පතට එය ඇතුළත් කිරීම මගින් වැය සහතික කරන නිලධාරීන් ඒ පිළිබඳව දැනුවත් කළ බවටද ඉල්ලුම්කරු වැඩිදුරටත් සාක්ෂි දී ඇත.

හතරවන චෝදනාවේ සඳහන් පරිදි තමන් විසින් වගකීම් අනලස්ව විශ්වාස දායකව සපුරාලීම හෝ ඉටුකිරීම පැහැරහැර නොමැති බවද ඉල්ලුම්කරුගේ සාක්ෂියෙන් ප්‍රකාශ වී ඇත. A 12B සටහන තුළින් තමන් සියල්ල හෙළිකර ඇති බවද වැඩි දුරටත් ප්‍රකාශ කර සිටී. තවද මෙවැනි වංචාවක් සිදුව ඇත්නම් ඒ පිළිබඳව සහකාර කළමනාකාර මුදල් විසින් කටයුතු කළ යුතුව තිබිය යුතු බවටද ඉල්ලුම්කරු වැඩිදුරටත් කරුණු දක්වා ඇත.

මේ හැර ඉල්ලුම්කරු ප්‍රකාශ කර ඇත්තේ ඉදිරිපත්තර ඇති සාක්ෂිවලට අදාළ පුද්ගලයන්ගෙන් හරස් ප්‍රශ්ණ විමසීමට තමන්ට අවස්ථාවක් ලබාදී නොමැති බවයි. එසේ අවස්ථාවක් දිය යුතු බව ආයතනයේ විනය ව්‍යවස්ථාවේ 4.4 (එකී ලේඛනය A 140 ලෙස ලකුණුකර සිටී.) යටතේ ඇති බව ඉල්ලුම්කරු වැඩි දුරටත් ප්‍රකාශකර සිටී. (පිටු අංකඃ25) තවද මෙම බිල්පත් ව්‍යාජ ද නැතිද යන්න විමසීමට හෝ විනය විභාගයේදී ආයතන පාර්ශවයෙන් කිසිවකු කැඳවා නොමැති බවද ප්‍රකාශකර සීටී. (පිටු අංකඃ 26)

මේ අනුව 2013.07.31 දින දඬුවම් වශයෙන් තමන් සේවයෙන් පහකළ බවද ප්‍රකාශ කර ඇත. තමන් ඊට අභියාචනාකල පසු සේවයේ නැවත පිහිටුවා 111 ශ්‍රේණියේ සිට v ශ්‍රේණියට ශ්‍රේණි දෙකකින් පහත හෙළීමක් සිදුකර ඇති බවද කියා සිටී. ඒ හේතුවෙන් තමන්ට අහිමි වූ වැටුප A17 ලේඛනය මගින් ඉදිරිපත් කර සිටින අතර ඒ අනුව තමන්ට අහිමි වූ මුළු මුදල රුඃ 4,04,330.25 බවද කියා සිටී.

හරස් ප්‍රශ්ණඃ-

2019.01.09 දින ඉල්ලුම්කරුගෙන් හරස් ප්‍රශ්ණ විමසීම ආරම්භ කරන ලදී. එහීදී ඉල්ලුම්කරු 1997.04.10 සිට ආයතනයේ සේවයට බැඳුණු බව ප්‍රකාශ කළ අතර, අදාළ පත්වීම් ලිපිය ආර්. 1 ලෙස ලකුණු කරන ලදී. තවද 2012.01.23 දින සිට ඉල්ලුම්කරු 111 B ශ්‍රේණියට උසස්වීම් ලද ලිපිය සාක්ෂිකරු මගින් ආර්. 2 ලෙසත්, ශ්‍රී ලංගම නුවර එළිය ශාඛාවේ සේවය කරමින් සිටියදී V ශ්‍රේණියට ලද උසස්වීම් ලිපිය ආර්. 3 ලෙසත් එහි දිනය ආර්. 3 A ලෙසත් ලකුණුකර ඇත. ඉල්ලුම්කරුට විෂමාචාරයක් සම්බන්ධයෙන් චෝදනාවක් ලද බවත් 2012.07.13 දින එය ලද පසු අභ්‍යන්තර නඩු විභාගයක් පැවැත්වූ අතර එකී චෝදනා පත්‍රය චෝදනා 5 කින් යුක්ත බවත් (එය ආර්. 4 ලෙස සලකුණු කර) ඉල්ලුම්කරුගෙන් හරස් ප්‍රශ්ණ විමසීමේදී චෝදනා පත්‍රය ලැබුණු බව පිළිගෙන ඇත.

චෝදනා පත්‍රයේ චූදිතට කළ ආමන්ත්‍රණය සම්බන්ධයෙන් හරස් ප්‍රශ්ණ විමසීමේදී දීර්ඝ වශයෙන් ප්‍රශ්න කිරීමට භාජනය වූ අතර එකී ආමන්ත්‍රණය කොටස ආර්. A4 ලෙස සලකුණුකර ඉදිරිපත්කර ඇත. තවද චෝදනා පත්‍රයේ ආමන්ත්‍රණය 2011 තමන් චෝදනාව ලබන විට සිටි තනතුරට අදාළව නිවැරදි බවත් කෙසේ වූවද තමන්ට පත්‍රය ලැබෙන විට තමන් එම සේවා ස්ථානයේ හෝ එම තනතුරේ නොසිටි බවත් ඉල්ලුම්කරු සිය සාක්ෂියේදී ප්‍රකාශකර ඇත.

හරස් ප්‍රශ්ණ විමසීමේදී ඉල්ලුම්කරුට චෝදනා පත්‍රය ලබාදීමට පෙර ඉල්ලුම්කරුගෙන් ලබාගත් ප්‍රකාශයක් සම්බන්ධයෙන් විමසීම් කරන ලද අතර එය ආර්. 5 ලෙස සලකුණුකර ප්‍රශ්ණ කර ඇත. ඉල්ලුම්කරු එකී ප්‍රකාශය තමන්ගේ බව පිළිගත් අතර එය කිසිදු බලපෑමකින් තොරව සිදුකල සත්‍ය ප්‍රකාශයක් බවට ප්‍රකාශයේ සඳහන්කර ඇති බවද පිළිගන්නා ලදී. කෙසේ වුවද එකී ප්‍රකාශනයේද ඉල්ලුම්කරු තමාව හඳුන්වා දී ඇත්තේ නුවරඑළිය ප්‍රාදේශිකයේ සේවය කරන නිලධාරියෙක් ලෙස බව ඉල්ලුම්කරු ගෙන් හරස් ප්‍රශ්ණ විමසීමේදී ප්‍රකාශ කර ඇති අතර (2019.01.09 සාක්ෂි සටහන් පිටු අංකඃ 20) කෙසේ වූවද ප්‍රකාශය නිවැරදි බවත්, ප්‍රකාශය ලබාදෙන අවස්ථාවේ තමන් සේවය කලේ මහනුවර ප්‍රාදේශිකයේ බවත් ඉල්ලුම්කරු වැඩි දුරටත් ප්‍රකාශ කර සිටී.

කෙසේ වූවද මෙම ප්‍රකාශය ලබාදීමෙන් පසු තමන්ට චෝදනා පත්‍රයක් ගොනු වූ බවද, ඉන්පසු ඒ පිළිබඳව පැවැත්වූ විභාගයේදී තමන් නියෝජිතයන් සමග පෙනී සිටි බවද ඉල්ලුම්කරුගෙන් හරස් ප්‍රශ්ණ විමසීමේදී පිළිගෙන ඇත.

එකී විනය විභාගයේ සටහන් A 6 ලෙස සලකුණුකර ඒ පිළිබඳව වැඩිදුර ප්‍රශ්න කරන ලද අතර එම විභාගයේදී විනය නිලධාරියාගෙන් හරස් ප්‍රශ්ණ විමසීමට තමන්ට අවස්ථාව ලද බව ඉල්ලුම්කරු පිළිගෙන ඇත. (පිටු අංකඃ28) තවද එකී විනය විභාගය පැවැත්වූ ආකාරය

සතුටුදයක බවට සඳහන් කොටස ආර්. 6 B ලෙසත් ඒ සඳහා ඉල්ලුම්කරු සහ ඔහුගේ නියෝජිත මහතා අත්සන් කල කොටස ආර්. 6B ලෙසත් හරස් ප්‍රශ්ණ විමසීමේදී සලකුණුකර ඉදිරිපත් කරන ලදී.

2019.01.29 වැඩිදුර හරස් ප්‍රශ්ණ විමසීම සිදුකරන ලද අතර එහිදී ඉල්ලුම්කරුට චෝදනා පත්‍රයක් ලද බව ඉල්ලුම්කරු පිළිගත් අතර එය ආර්.04 ලෙස සලකුණු කර සිටි. එකී චෝදනා පත්‍රයේ විගණන සාකච්ඡාව පැවැත්වූ දිනය පමණක් පිළිගන්නා ඉල්ලුම්කරු එහි සඳහන් අනෙකුත් කරුණු ප්‍රතික්ෂේප කර සිටී. පළමු චෝදනාව සම්බන්ධයෙන් කියා සිටින්නේ තමන් විගණන සාකච්ඡාව කිරීමේදී මිල ගණන් කැඳවීමන් නොකළ බවත්, සාකච්ඡාවට ආයතනය වෙන් කිරීමේ මිල ගණන් කැඳවීමේ ක්‍රමවේදයක් පිළිබඳව තමන් දැනුවත්ව නොසිටි බවත් ය. මීට අමතරව නිවහන ඩිලුක්ස් ආයතනය වෙන්කිරීම තමන් විසින් සිදු නොකළ බවත්, ප්‍රධාන ගිණුම් පරීක්ෂකගේ උපදෙස් පරිදි නුවරඑළිය ඩිපෝවේ සහකාර කළමණාකාර මුදල් වෙත දන්වා එය වෙන්කරගත් බවත් වැඩිදුරටත් කියා සිටි. කෙසේ වුවද පසුව ප්‍රකාශ කර සිටින්නේ සහකාර කළමනාකාර මුදල් සමඟ ආයතනය වෙන්කර ගැනීමේ කටයුත්තට තමාද සහභාගී වූ බවයි. ආර්.4 ලේඛනයේ දෙවන චෝදනාව ප්‍රතික්ෂේප කරමින් ඉල්ලුම්කරු ප්‍රකාශ කර සිටින්නේ ආහාරපාන සහ විගණන සාකච්ඡාව සඳහා එක් අයෙකුට රු.625/ ක මුදලක් වෙන්කළ බවත් ඒ සඳහා මිල ගණන් කැඳවීමෙක් නොකළ බවත්ය. මේ පිළිබඳව තවදුරටත් කියා සිටින්නේ 2009 වර්ෂයේත් මෙම ආයතනයේ විගණන සාකච්ඡාව පැවැත්වූ බැවින් එලෙසම මිල ගණන් කැඳවීම් නොමැතිව ආයතනය තෝරාගත් බවත්ය.

තවද විගණන සාකච්ඡාවට අදාළ බිල්පත ආර් 7 ලෙස සලකුණු කරමින් එහි අත්සන් කර ඇත්තේ කවරෙක්ද යන්න විමසීමේදී ඉල්ලුම්කරු ප්‍රකාශ කර ඇත්තේ මෙහි ප්‍රධාන අභ්‍යන්තර ගිණුම් පරීක්ෂකවරයා මුලින් අත්සන් කළ බවත් තමන්ද ඉන් පසු අත්සන් කල බවත්ය. කෙසේ වුවද ඉල්ලුම්කරු පසුව අත්සන් කල බව තහවුරු කිරීමට සාක්ෂි ඉදිරිපත් නොවිණි. මේ හැර හරස් ප්‍රශ්ණ විමසීමේදී ආර් 08 ලේඛනය සලකුණු කරමින් වග උත්තරකාර පාර්ශවය විසින් දීර්ඝ වශයෙන් හරස් ප්‍රශ්ණ විමසීම කර ඇත . මෙහිදී ආර් 08 නමැති ලේඛනය එනම් වැයපත තමන් විසින් සකස්කළ බවත් ඉහතකී ආර් 07 බිල් පත්‍රයේ නොමැති කරුණක් වන නවාතැන් ගාස්තු තමන් විසින් වැය සකස් කිරීමේදී ඇතුලත් කර ඇති බවත් ඉල්ලුම්කරු විසින් පිළිගෙන ඇත. විගණන සාකච්ඡාව සඳහා නවාතැන් වියදම් ලබා නොදෙන බැවින් තමාගේ ඉහල නිලධාරියකුවන ප්‍රධාන අභ්‍යන්තර ගිණුම් පරීක්ෂකවරයා ලබාගත් නවාතැන් සඳහා වූ ගාස්තුව "ආහාර සහ නවාතැන්" යනුවෙන් තමා විසින් වැයපතට ඇතුළත් කර ඇති බව ඉල්ලුම්කරු ප්‍රකාශ කර ඇත. එය එසේ තමන් ඇතුළත් කළේ ඩිපෝ කළමනාකාර සහ සහකාර මුදල් කළමනාකාර දැනුවත් වීමට සහ තමන්ගේ නිදහසට බවත් ඉල්ලුම්කරු වැඩි දුරටත් ප්‍රකාශ කර ඇත. තවද තමන්ගේ ඉහල නිලධාරියා වන සිරිල් රංජිත් පතිරණ යන අය මෙම නවාතැන් පහසුකම් ලබාගත් බවත් ඔහුගේ උපදෙස් පරිදි ඉහත සඳහන් කළ ආකාරයට එකී වියදම වැයපතට ඇතුළත් කළ බවටත් ඉල්ලුම්කරු සාක්ෂි දී ඇත. එසේ කිරීමෙන් තමන් වැරැද්දක් කර ඇති බවද ඉල්ලුම්කරු පිළිගෙන ඇති අතර ඉහල නිලධාරියාගේ උපදෙස්වලට යටත්ව එසේ සිදුකළ බව වැඩි දුරටත් ප්‍රකාශ කර ඇත.

චෝදනා පත්‍රයේ තෙවන චෝදනාවටද තමන් වැරදිකරු නොවන බව ඉල්ලුම්කරුගෙන් හරස් ප්‍රශ්ණ විමසීමේදී ප්‍රකාශ කර ඇත. විගණන සාකච්ඡාව සඳහා මුදල් ගෙවූ බිල්පත් ආර් 7 ලෙස සලකුණුකර ඉල්ලුම්කරුගෙන් හරස් ප්‍රශ්ණ විමසා ඇති අතර බිල්පතට අනුව සහභාගී වූ සංඛ්‍යාව 69ක් ලෙස සඳහන් වුවත් ඒ13 අත්සන් පත්‍රයේ සඳහන් සංඛ්‍යාව ඊට නොගැලපෙන බවත් සාක්ෂිකරුගෙන් සාක්ෂි විමසීමේදී පිළිගෙන ඇත. තවද තමන් විසින් සකස් කර ඇති වැයපතේ බිල්පත් අංකය වැරදි ලෙස සටහන් කර ඇති බවත් එය තමාගේ නොසැලකිල්ල මත සිදුවූ බවත් ඉල්ලුම්කරු විසින් පිළිගෙන ඇත.

2019.02.27 දිනද වැඩිදුර හරස් ප්‍රශ්ණ විමසීම සිදුකල අතර, මෙහිදී සාකච්ඡා සඳහා පැමිණි සංඛ්‍යාව සහ පැමිණිම සටහන්කල නම් ලැයිස්තුව අතර පරස්පර විරෝධිතාවයක් ඇති බව ඉල්ලුම්කරු පිළිගෙන ඇත. (පිටුව 02) ඒ අනුව ප්‍රධාන විගණන නිලධාරි සිරිල් රංජිත් පතිරණ යන අයට මණ්ඩලීය මුදල් වංචා කිරීමට ආධාර අනුබල දී ඇති බවට වග උත්තරකාර පාර්ශවය චෝදනා කර ඇති අතර ඉල්ලුම්කරු එය පිළි නොගනී.

ඉල්ලුම්කරුට ලැබී ඇති හතරවන චෝදනාව වගඋත්තරකාර පාර්ශවයේ හරස් ප්‍රශ්ණ සඳහා භාජනය වූ අතර ප්‍රධාන විගණන නිලධාරි නවාතැන් පහසුකම් ලබාගත් බවට දැනගෙනම වැයපත සකස්කර ඇති බවට ප්‍රශ්ණ කර ඇති අතර ඉල්ලුම්කරු එය පිළිගෙන ඇත. (පිටු අංක 6, 7) ඒ අනුව ඉල්ලුම්කරු ආයතනයට විශ්වාසවන්තව කටයුතු නොකර සිරිල් රංජිත් යන අයට මණ්ඩලයේ මුදල් වංචා කිරීමට ආධාර අනුබල දුන් බවට චෝදනා කර ඇත. මේ හැර ඉල්ලුම්කරු ලබාගන්නා වැටුප V ශ්‍රේණියට අදාළ වැටුපක් බවත් විනය නියෝගයෙන් පසු තමන් සේවයේ පහත හෙලා එම වැටුප් තලයේ පිහිටුවා ඇති බවත් ඉල්ලුම්කරු ප්‍රකාශ කර ඇත. (පිටු අංක : 7) කෙසේ වුවද තමන් විසින් A 9 අභියාචනය ඉදිරිපත් කල පසු නැවත සේවයේ පිහිටුවා ඇති බවද ඉල්ලුම්කරු ප්‍රකාශ කර ඇත. තවද ඉල්ලුම්කරු විසින් A 17 ලෙස ඉදිරිපත් කර ඇති හිඟ වැටුප් ලේඛනය වග උත්තරකාර පාර්ශවයේ අභියෝගයට ලක්වූ අතර එය මෙම අධිකරණයෙන් අයුතු ප්‍රයෝජන ගැනීමක් ලෙසටද යෝජනා කර ඇත.

2019.03.07 දින ඉල්ලුම්කරුගෙන් නැවත ප්‍රශ්ණ විමසීම සිදුකර ඇති අතර, චෝදනා පත්‍රයේ තමන්ට ආමන්ත්‍රණය කර ඇති ආකාරය නිවැරදි නොවන බව ඉල්ලුම්කරු ප්‍රකාශකර ඇත. තම තනතුර සහ සේවය කළ ස්ථානය වැරදියට සටහන් කර තමන්ට චෝදනා පත්‍ර ලබාදී ඇති බව ඉල්ලුම්කරු වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත. ආර්. 5 චෝදනා පත්‍රයෙහිද එලෙසම තමන්ගේ තනතුර V ශ්‍රේණියේ ගිණුම් පරීක්ෂක ලෙස සටහන් කිරීම නිවැරදි නොවන බවත් සේවා ස්ථානයද නිවැරදිව දක්වා නොමැති බවටත් කරුණු දක්වා ඇත. තවද,

විනය විභාගය පැවැත්වූ ආකාරය පිළිබඳව තමන් ''සතුටුදයකයි'' යනුවෙන් තමන් අත්සන් කල බව ඉල්ලුම්කරු පිළිගෙන ඇත. කෙසේ වුවද සාක්ෂි නොකැඳවීම වැනි වෙනත් කරුණු තමන් ඊය පාදක කර නොගත් බවද ඉල්ලුම්කරු ප්‍රකාශ කර ඇත.

මිල ගණන් කැඳවීම පිළිබඳව නඩු විභාගයේදී ප්‍රශ්න කලද, විමර්ෂණ නිලධාරියා විසින් කරන ලද විමර්ශනයේදී එසේ ප්‍රශ්න නොකළ බවද ප්‍රකාශ කර ඇත. (2019.03.27 සාක්ෂි සටහන පිටු අංක : 9 ) තවද නිවහන බිලුක්ස් ආයතනය වෙන් කිරීමට ඩිපෝ සහකාර කළමනාකාර සමග තමන්ද ගිය බවත්, මුදල් ගෙවීමට බලය ඇත්තේ ඩිපෝ කළමනාකාර වරයාට බවත් අදාළ හෝටලය විසින් මිල ගණන් පිළිබඳව එකී කළමනාකාර වරයා දැනුවත් කර ඇති බවත් ඉල්ලුම්කරු වැඩි දුරටත් ප්‍රකාශ කර ඇත.

මේ හැර වැයපත සකස් කිරීමේ වගකීම තමන්ට තිබූ බවත්, ඒ සම්බන්ධයෙන් වෙනත් වගකීමක් තමන්ට නොමැති බවත් ප්‍රකාශ කර ඇත. තවද බිල්පතේ නවාතැන් ගාස්තු නොතිබූ හෙයින් ඉහල නිලධාරින් දැනුවත් කිරීමට එයද බිල්පතට ඇතුළත් කල බව ඉල්ලුම්කරු ප්‍රකාශ කර ඇත.(9 පිටු අංකඃ 14) කෙසේ වුවද වැයපත සම්බන්ධයෙන් ගෙවීම් කරන නිලධාරින් එයට ගෙවීම් කිරීමට පෙර වැයපතෙහි වැරදි ඇත්නම් ඊට නොගෙවා සිටීමේ හැකියාවක් තිබූ බවටද ඉල්ලුම්කරු නැවත ප්‍රශ්න විමසීමේදී ප්‍රකාශ කර ඇත. තවද එලෙස වැරැද්දක් තිබුණේ නම් වැය සහතික කිරීමේ නිලධාරි ඒ පිළිබඳ තමන්ගෙන් ප්‍රශ්න කළ යුතු නමුත් එසේ නොකළ බවද ප්‍රකාශ කර සිටී. තවද ඉල්ලුම්කරු විසින් සිරිල් රංජිත් පතිරණ යන අයට මුදල් වංචා කිරීමට ඉඩ දුන්නේය යන චෝදනාවද ඉල්ලුම්කරු විසින් ප්‍රතික්ෂේප කර ඇත.

2019.04.02 දින ඉල්ලුම්කාර පාර්ශවයේ ඉල්ලීම පරිදි ඉල්ලුම්කාර පාර්ශවය වෙනුවෙන් සාක්ෂි දීම සඳහා වග උත්තරකාර පාර්ශවයේ සාක්ෂිකරුවකු වන ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ නුවරඑළිය කාර්යාලයේ ප්‍රාදේශීය මුදල් කළමණාකාරවරයා වන චන්දන කමල් හේරත් යන අයගෙන් සාක්ෂි විමසා සිටියද 2019.06.14 දින ඉල්ලුම්කාර පාර්ශවය කියා සිටින්නේ 2019.04.02 වැනි දින සාක්ෂිදුන් සාක්ෂිකරුගේ සාක්ෂිය අසම්පුර්ණ සහ ඔහු තව දුරටත් එකී තනතුරේ නොමැති බැවින් ඔහුගේ සාක්ෂිය ඉවත්කරන ලෙසයි. ඒ අනුව දෙපාර්ශවයේ ම එකඟතාවය මත එම සාක්ෂිය ඉවත් කරනු ලබයි. නව සාක්ෂිකාරිය වශයෙන් ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ නුවරඑළිය කාර්යාලයේ ප්‍රාදේශීය මුදල් කළමණාකාරවරිය වන ටී. එම්. එස්. කේ. තෙන්නකෝන යන අය ඉල්ලුම්කාර පාර්ශවය වෙනුවෙන් සාක්ෂියට කැඳවා සිටී. සාක්ෂිකාරිය විසින් A 17 සහ ආ 17 A ලේඛන අභ්‍යන්තර විගණනයට ලක්කොට නිවැරදි තොරතුරු ඉදිරිපත් කරයි. එකී විගණන වාර්තාව ඉල්ලුම්කාර පාර්ශවය විසින් A 17 B ලෙස සලකුණු කොට ඉදිරිපත් කර සිටී.

2017.07.22 වැනි දින මේ පිළිබඳ නැවත මූලික සාක්ෂි විමසීම සිදුකොට නිවැරදිතාවය තහවුරු කරගෙන ඇත. ඒ අනුව ඉල්ලුම්කරු විසින් ඉල්ලා ඇති හිඟ දීමනාව 274802.77 ක් ලෙස විගණන පිරික්සුම අනුව ගණනය කර ඉදිරිපත් කර ඇත.

මේ පිළිබඳව හරස් ප්‍රශ්ණ විමසීමද මෙදින සිදුවූ අතර එහීදී ඉල්ලුම්කරු අදළ තනතුරේ සිටියේ නම් එම කාලයට ලැබිය යුතු වැටුප් සහිත ලේඛණය ඒ 17 බී ලෙස ලකුණු කර සිටී. (පිටු අංක : 5 ) පිටු තවද සාක්ෂිකාරිය හරස් ප්‍රශ්නවලට භාජනය වීමේදී ප්‍රකාශ කර ඇත්තේ ඉල්ලුම්කැරට ලැබුණු විනය නියෝගය මත දඬුවම් වශයෙන් ඉල්ලුම්කරු වහාම සේවයෙන් පහ කිරීමත් ඉන්පසු අභියාචනා සම්බන්ධ නියෝගයන් මත ඉල්ලුම්කරු v ශ්‍රේණියට පහත හෙලා 2013.11.01 සිට එම ශ්‍රේණියේ ආරම්භක වැටුප් තලයේ පිහිටුවා ඇති බවත් ඉන්පසු මාවනැල්ල ඩිපෝවට මාරුකර යවා ඇති බවත් අභියාචනා නියෝගයද R 10 ලෙස සලකුණු කර ප්‍රකාශ කර ඇත. තවද මේ අනුව ඉල්ලුම්කරු විසින් හිඟ වැටුප් ඉල්ලා ඇති ඒ17 , ඒ 17 ඒ, ලේඛන විගණනයට ලක්කර ඒ17බී ලේඛණය සකස් කර ඇති බවත්, ඒ අනුව ඉල්ලුම්කරු තනතුරෙන් පහත හෙලා නොතිබුණේ නම් එකී වැටුප ලබා ගැනීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කර ඇත. මේ අනුව මෙදින ඉල්ලුම්කාර පාර්ශවයේ සාක්ෂි අවසන් කර ඇත.

2019.08.23 වැනි දින වග උත්තරකාර පාර්ශවයේ සාක්ෂි සඳහා පළමු ශ්‍රේණියේ නිලධාරියෙකු වන ඉන්දික චන්දිමාල් ද සිල්වා කැඳවා ඇත. වග උත්තරකාර ආයතනයේ සභාපතිවරයා විසින් තමන්ට එවකට සේවය කළ විගණන පරීක්ෂක සිරිල් රංජිත් පතිරණ යන අය බිල්පත් වෙනස් කර මුදල් වංචාවක් කිරීම සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් කිරීමට තමන්ට භාරදුන් බව කියා සිටී. එම පරීක්ෂණ කරන විට ඉල්ලුම්කරුගේද ඊට දයකත්වයක් තිබූ බව හෙළි වූ බවද එකී විගණන සාකච්ඡාව 2011.10.28 නුවරඑළියේදී පැවැත් වූ බවත් ප්‍රකාශ කර ඇත. තවද සාකච්ඡාව පැවැත්වීමට ස්ථානයක් තෝරා ගැනීම ආදිය අංශ ප්‍රධානි විසින් කරන බවත් මෙහිදී 2011 වසරේ එකී විගණන පරීක්ෂණය සිදුකල ස්ථානයම එය නුවරඑළිය ප්‍රාදේශීය විගණන පරීක්ෂක විසින් තෝරාගෙන ඇති බව ඉල්ලුම්කරුගේ ප්‍රකාශය අනුව පෙනී යන බව සාක්ෂිකරු ප්‍රකාශ කර ඇති අතර එකී ලේඛණය ආර් 12 ලෙස ලකුණු කර ඇත. මෙම ඉල්ලුම්කරු විසින් විමර්ශනයේදී ලබාදුන් ප්‍රකාශය ආර් 5 ලෙස සලකුණු කර මේ බව තව දුරටත් සහතික කර සිටී. ( සාක්ෂි සටහන් පිටු අංක : 8) පෙර අවස්ථාවේදීත් මෙම ස්ථානය තෝරාගෙන තිබීම, ආහාර මිල ගණන්වල පෙරට වැඩි වෙනසක් නොවීම මත ඉල්ලුම්කරු මෙම ස්ථානය තෝරාගෙන ඇති බව ඉල්ලුම්කරුගේ ප්‍රකාශයෙන් එනම් R 5 අනුව තහවුරු වන බවටද සාක්ෂිකරු සාක්ෂි ලබාදී ඇත. ඉල්ලුම්කරු මිල ගණන් කැඳවීමක් කර නොමැති බවත්, පෙර අවස්ථාවේ තෝරාගත් ආයතනය මිල ගණන් එතරම් වෙනසක් නොවූ බැවින් ඉල්ලුම්කරු විසින් මෙම සාකච්ඡාව සඳහා තෝරාගෙන ඇති බවට ඉල්ලුම්කරු විසින් තමන් කළ පරීක්ෂණයේදී හෙළිදරව් කර ඇති බව සාක්ෂිකරු හෙළිදරව් කර ඇත. R 5 D ලේඛණයේ පිටු අංක : 31-39 දක්වා මේ බව සටහන් බවට සාක්ෂිකරු වැඩි දුරටත් සාක්ෂි ලබාදී ඇත. ප්‍රධාන විගණන පරීක්ෂකගේ ඉල්ලීම මත ඔහුට නිවහන ඩිලුක්ස් ආයතනයේ නවාතැන් ලබාදුන් බවත් ඉල්ලුම්කරු සිය R 5 ප්‍රකාශයේ සඳහන් කර ඇති බව සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත. තවද නිවහන ඩිලුක්ස් ආයතනය වෙන්කරවා ගැනීමේදී සිරිල් රංජිත් පතිරණ අය ඉල්ලුම්කරුට දුරකතනයෙන් දැනුම් දුන් බවද, ඒ බව R 5 ලේඛනයේ R 5 F ලෙස සටහන්ව ඇති බවට සාක්ෂිකරු

සඳහන් කර ඇත. මේ හැර ප්‍රධාන අභ්‍යන්තර ගිණුම් පරීක්ෂක විසින් ගෙවිය යුතු නවාතැන් ගාස්තු වන රුපියල් තිස්දහසක් (30000/) වූ මුදල අයකර ගැනීම පිණිස ඉල්ලුම්කරු විසින් R 7 ලේඛනයේ සඳහන් බිල්පත් වෙනස් කොට ආහාර වේලේ වටිනාකම රු: 800/ ක් ලෙසද වැයපත සකස්කර ඇති බවත් ඒ බවට විනය විභාගයේදී ඉල්ලුම්කරු විසින් සාක්ෂි දී ඇති බවත්, ඒ බව ඉල්ලුම්කරු විසින් කළ R 5 ප්‍රකාශයේ R 5 G ලෙස සටහන් වන බවත් ඒ බව තම පරීක්ෂණයේදී අනාවරණය කරගත් බවටත් සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත. (සාක්ෂි සටහන් පිටු අංක : 12)

මේ හැර R 7 බිල්පත්‍රයෙහි සහ R 8 වැයපතෙහි ඉල්ලුම්කරු සහ ප්‍රධාන අභ්‍යන්තර ගිණුම් පරීක්ෂකගේ අත්සන තබා ඇති බවත් ඔවුන් එලෙස අත්සන් කර ඇත්තේ ඒවායේ සඳහන් විස්තර සාධාරණ සහ යුක්ති සහගත බව දක්වීමට බවටත් සාක්ෂිකරු සාක්ෂි දී ඇත. තවද මෙවැනි වව්චර් සකස් කිරීමේ වගකීම වැය සහතික කරන නිලධාරියාට සහ එය සකස් කරන නිලධාරියාට පැවරෙන බවද සාක්ෂිකරු වැඩි දුරටත් ප්‍රකාශ කර ඇත. තවද මෙම විෂමාචාරය විගණනය සිදු කරන නිලධාරීන් දෙදෙනකු අතින් සිදුව ඇති බවද සාක්ෂිකරු වැඩි දුරටත් ප්‍රකාශ කර ඇත. ( සාක්ෂි සටහන් පිටු අංකඃ 24 ) කෙසේ වුවද මෙම නඩුවේ ඉල්ලුම්කරු විසින් තම ඉහල නිලධාරියාගේ මෙම විෂමාචාරය මණ්ඩලයේ සභාපතිවරයාට වාචිකව හෝ ලිඛිතව පැමිණිලි කළ හැකිව තිබුණද, එසේ කර නොමැති බවද වැඩි දුරටත් ප්‍රකාශ කර ඇත.

තමන් මෙම සාක්ෂියේ දී කියා සිටින කරුණු R 12 ලේඛනයේ සටහන්කර ඇති බවද සාක්ෂිකරු ප්‍රකාශ කර සිටී.

මේ හැර තමන් විමර්ශනයේදී විමර්ශනය සිදු කර කරුණු සටහන් කලා මෙන්ම විධිමත් විනය පරීක්ෂණයේදීද

R 6 B වශයෙන් ලකුණුකර ඇති ලේඛනය පරිදි සාක්ෂි ලබාදී ඇති බව සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත. මේ අනුව ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ 4 ව්‍යවස්ථාවේ ඒ උපලේඛණය පරිදි ඉල්ලුම්කරු මණ්ඩලීය මුදල් වංචා කිරීමට අධාර අනුබල දීමක් කර ඇති බව සාක්ෂිකරු සිය සාක්ෂියේදී ප්‍රකාශ කර ඇත. 323 පී

2019.09.18 දින වග උත්තරකාර පාර්ශවයේ සාක්ෂි ලබාදීම ආරම්භ වූ අතර වග උත්තරකාර පාර්ශවය විසින් විනය ව්‍යවස්ථා මාලාව R 13 ලෙසත්, ඉල්ලුම්කරුට අදාළ 4 වගන්තිය R 13 A ලෙසත් ඒ උපලේඛනයේ R 13 බී ලෙසත් ලකුණු කර සිටී.

සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්ණ විමසීමේ දී ප්‍රකාශ කර ඇත්තේ සාක්ෂිකරු විශේෂ විමර්ෂණ ඒකකයේ කළමනාකරු ලෙස සේවය කල බවත් මෙම නඩුවේ ඉල්ලුම්කරු සම්බන්ධයෙන් විමර්ශනය කළ බවත්, ඒ සඳහා පාදක කර ගත්තේ ''ශ්‍රී ලංගම සුරැකීමේ සංවිධානය විසින් ලේකම්තුමා ප්‍රවාහන අමාත්‍යංශය ඇමතු ලිපියක් බවත්ය. එකී ලිපිය ලේකම් තුමා විසින් අධ්‍යක්ෂ විශේෂ විමර්ශන වෙත යොමුකළ පසු තමන්ට ලැබුණු බවත් ප්‍රකාශ කර ඇත. එකී ලේඛනය R 11 ලෙස සලකුණු කර ඇති බවද කියා සිටී. මෙම R 11 ගැන විමර්ශනයේදී 2011.10.28 පැවැත්වූ විගණන සාකච්ඡාවේදී ඇතිවූ අක්‍රමිකතාවයන් පිළිබඳව හෙළිවූ බවද ප්‍රකාශ කර ඇත. ප්‍රධාන විගණන නිලධාරි සිරිල් රංජිත් පතිරණ යන අය තාවකාලිකව මුදල් වවුචරයකින් මුදල් ලබාගෙන එය නොපියවීම මත විමර්ශනය කල බවත් කෙසේ වුවද ඉල්ලුම්කරු සම්බන්ධයෙන් පැමිණිල්ලේ චෝදනා සඳහන්ව නොතිබූ බවත් සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත. කෙසේ වුවද ඉහත කී අක්‍රමිකතාවය සම්බන්ධයෙන් සොයා බැලීමේ දී අනුබද්ධිත කරුණක් වශයෙන් ඉල්ලුම්කරු සම්බන්ධයෙන් විමර්ශනය කිරීමට සිදුවූ බවද ප්‍රකාශ කර ඇත. කෙසේ වුවද තමන්ගේ පරීක්ෂණ වාර්තාවේ චෝදනා ලබන්නන් ලෙස ප්‍රධාන අභ්‍යන්තර ගිණුම් පරීක්ෂක සිරිල් රංජිත් පතිරණ, නිලවාහන රියදුරු එස්. වසන්ත කුමාර, අභ්‍යන්තර ගිණුම් පරීක්ෂක නිමල් රණතුංග යන අයගේ නම් සඳහන් වන බවද, සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත. තවද ආර්. 11 හි කරුණු පාදක කර ගනිමින් කරන ලද විමර්ශනයේදී ඉල්ලුම්කරු විසින් සිදු කරන ලද විෂමාචාර අනාවරණය කරගත් බවට සාක්ෂි ලබා දී ඇත. තවද පැමිණිල්ලේ කරුණු තහවුරු කර ගැනීමට සිද්ධිගත මූලාශ්‍ර යොදා ගත් බවද, පැමිණිල්ල සාක්ෂියට කැඳවීම හෝ පැමිණිල්ලෙන් ප්‍රකාශන ලබා ගැනීම අවශ්‍ය නොවූ බවටද කරුණු දක්වා ඇත. මේ හැර ප්‍රධාන විගණන පරීක්ෂක එනම් ආර් 11 පැමිණිල්ලෙන් මූලික වශයෙන් චෝදනා ලැබූ ප්‍රධාන විගණන පරීක්ෂකවරයා සම්බන්ධයෙන් ගෘහස්ත පරීක්ෂණයක් සිදු නොකල බවත්, ඔහු කොන්ත්‍රාත් සේවකයෙක් නිසා ඔහුගේ සේවය අවසන් කිරීම පමණක් සිදුකර ඇති බවත් සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත. (සාක්ෂි සටහන් 2019.09.18 පිටුව 17)

තවද තමන්ගේ විමර්ශන වාර්තාව 2012.06.19 භාර දුන් බවත් 2012.06.30 වැනි දින ප්‍රධාන විගණන පරීක්ෂක සේවයෙන් ඉවත් කර ඇති බවටත් කරුණු දක්වා ඇත. තමන්ගේ විමර්ශන වාර්තාවෙන් ද තමන් විසින් ඔහුගේ සේවා කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට නියමිත දිනට පසු තවදුරටත් සේවයේ තැබීමට නුසුදුසු බවට තමන් නිර්දේශ කර ඇති බවද සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත. (සාක්ෂි සටහන් පිටු අංකඃ 18) තවද තමන්ගේ විමර්ශන වාර්තාවෙන් ඉල්ලුම්කරුට චෝදනා කරන්නේ විගණන සාකච්ඡාවට අදාළ බිල්පත් සැකසීමේදී සිදුකර ඇති විෂමාචාරය හේතුවෙන් සිරිල් රංජිත් පතිරණ මහතාට මුදල් වංචා කිරීමට ආධාර අනුබලදීම සම්බන්ධයෙන් බවද සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත. (පිටු අංකඃ 19) තවද ආර් 8 නමැති එකී බිල්පත සැකසීමේදී මණ්ඩලීය පිළිවෙත් අනුව ගෙවිය නොහැකි බව ඉල්ලුම්කරු විසින් සිරිල් රංජිත් යන අයට දැන්වූවද බිල්පත මුළු මුදලට ම සකස් කරන මෙන් ඔහු විසින් ඉල්ලුම්කරුට උපදෙස් ලබාදී ඇති බව තම විමර්ශනයේදී අනාවරණ වූ බව සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත. (පිටු අංකඃ19)

2019.10.10 දින වග උත්තරකාර පාර්ශවයේ සාක්ෂිකරුගෙන් වැඩිදුර හරස් විමසීම සිදුවිය. තවද සාක්ෂිකරුගෙන් සාක්ෂි විමසීමේදි ඉල්ලුම්කරුගේ සේවා ස්ථානය සහ තනතුරෙහි නිවැරදිභාවය සම්බන්ධයෙන් ප්‍රශ්ණ කර ඇති අතර ඉල්ලුම්කරු විසින් ලබාදුන්

හැඳුනුම්පත අනුව එම තොරතුරු සටහන් කර ඇති බවත් එකී තොරතුරු නිවැරදි බවට ඉල්ලුම්කරු අත්සන් තබා සහතික කර ඇති බවත්, ඒ අනුව එය නිවැරදි නොවන්නේ නම් නිවැරදි තොරතුරු සැපයීමේ වගකීම ඉල්ලුම්කරුට පැවරෙන බවටත් කෙසේ වුවද තමන් ලබාදෙන සියලු තොරතුරු නිවැරදි බවට ඉල්ලුමකරු R 5 ලේඛනයේ 3 පිටුවේ අත්සන් කර තම අත්සත යොද ඇති බවත් සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත. (පිටු අංකඃ 12)

තවද නිවහන ඩිලුක්ස් ආයතනය ඉල්ලුම්කරුගේ අභිමතය පරිදි තෝරා ගත්තේද යන්නට සාක්ෂි තිබේ ද යන්න විමසීමේදී සාක්ෂිකරු ප්‍රකාශකර ඇත්තේ ඒ බව ඉල්ලුම්කරුගේ ප්‍රකාශයක් වන R 5 ලේඛනයෙන් එය තහවුරුවන බවයි.

තවද අංකඃ 1068 බිල්පත සැකසීමට ඉල්ලුම්කරුගේ දායකත්වයක් තිබේද යන්න සාක්ෂිකරුගෙන් විමසීමේදී එය ඉල්ලුම්කරුගේ ප්‍රකාශය වන R 5 ලේඛනයේ R 5 g කොටසින් පැහැදිලි වන බව පෙන්වාදී ඇත. බිල්පතේ සටහන් ඉල්ලුම්කරු නොලිව්වද එය සැකසීමට ඉල්ලුම්කරු දායකවී ඇති බව සාක්ෂිකරු වැඩිදුරටත් පැහැදිලි කර ඇත. කෙසේ වුවද මේ පිළිබඳව බිල්පත අයත් ආයතනයෙන් තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කළ හෙයින් ආයතනය අසාදු ලේඛනයට ඇතුළත් කළ බවද සාක්ෂිකරු වැඩි දුරටත් ප්‍රකාශ කර ඇත.

තවද මෙම වව්චරයේ වැය සහතික කිරීම සිරිල් රංජිත් පතිරණ යන අය විසින් සිදු කර ඇති බවත්, ගෙවීම් කිරීමට ඔහු විසින් බලය ලබා දී ඇති බවත් ඔහු මණ්ඩලීය මුදල් බලධාරියාගේ සෘජු නියෝජිතයා බැවින් මෙය බැලූ බැල්මට විගණනයට ලක්වූ ලේඛනයක් බවටද සාක්ෂිකරු සාක්ෂි ලබාදී ඇත. තවද මෙම වවුචරය සම්බන්ධයෙන් ගෙවීම් කිරීමේදී ඩිපෝ කළමනාකරු නුවරඑළිය ඩිපෝව, ප්‍රාදේශීය මුදල් කළමනාකරු නුවරඑළිය, සහකාර කළමනාකරු මුදල් නුවරඑළිය යන අයද මණ්ඩලීය නිලධාරීන් වශයෙන් අත්සන් තබා ඇති බවද ප්‍රකාශ කර ඇත. කෙසේ වුවද ඔවුන් විසින් මෙම ගෙවීම මණ්ඩලයේ පිළිවෙතට පටහැනි බව සඳහන් කර නොමැති බවත්, ඔවුන් මෙම ගෙවීම වැරදි ගෙවීමක්ය යන්න නොදන්නා බවත් ප්‍රකාශ කර ඇත. ඉහල නිලධාරියා විසින් ගෙවීම් සහතික කර ඇති හෙයින් පහල නිලධාරීන් වශයෙන් මෙම නිලධාරීන්ට ගෙවීමේදී වරදක් පෙනෙන කාරණයක් නැතැයි යනුවෙන් එලෙස එකී නිලධාරීන් විසින් මෙම ගෙවීම්වල අඩුපාඩු හඳුනා නොගැනීමද සාක්ෂිකරු විසින් සාධාරණීකරණය කිරීමට හේතුවක් ලෙස ප්‍රකාශ කර ඇත. (2019.10.10 වැනි දින සාක්ෂි සටහන් පිටු අංකඃ 19) තවද එකී නිලධාරීන් මේ පිළිබඳව දැනගෙන ඉන්න ඕනද? යනුවෙන් ප්‍රශ්ණ කිරීමේදී සාක්ෂිකරු පවසා ඇත්තේ මෙහි බැලූ බැල්මට නීති විරෝධි බවක් නොමැති බවත්, අභ්‍යන්තරය දන්නා කෙනා දන්නවා යනුවෙනි. ඒ අනුවද මෙම ගෙවීමට අදාළ නිලධාරීන් මෙම ගෙවීමේ නිවැරදි බව සලකා නොමැති බව පැහැදිලි වේ. සාක්ෂිකරු වැඩි දුරටත් ප්‍රශ්න කිරීමේදී මෙම චෙක්පතේ සඳහන් මුදල් යමෙකුට වංචාවක් කිරීමට අනුබල දුන්න කියන්න බැහැ නේද? යනුවෙන් ප්‍රශ්න කිරීමේදී ප්‍රකාශ කර ඇත්තේ විගණන සාකච්ඡාව සඳහා භාවිතා කළ ආයතනය පෞද්ගලිකව පරිහරණය කර එම මුදලද මෙම ගෙවීමට ඇතුළත් කිරීම තුළින්ම වංචාවක් සිදුකර ඇති බවයි. (පිටුව21)

මේ හැර මෙම ගෙවීම් මුදල් රෙගුලාසිවලට අනුකූලද යන්න සාක්ෂිකරුගෙන් සාක්ෂි විමසීමේදී අවධාරණය කර ඇත. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ මුදල් රෙගුලාසි 102, 103, 104, A 21 වශයෙන් සලකුණුකර මෙසේ ප්‍රශ්න කර ඇත. මුදල් රෙගුලාසිවල 195 වගන්තියට අනුව ගෙවීමට බලය දුන් නිලධාරියා සහ වව්චරය සැකසූ නිලධාරියා යන දෙදෙනාම වගකිව යුතු බව සාක්ෂිකරුගෙන් සාක්ෂි විමසීමේදී හෙළිකර ඇත. මුදල් රෙගුලාසිවල 197 වගන්තියේ 2 වගන්තිය අනුව වව්චරය ඉතාමත්ම නිවැරදිව සකස් කල යුතු බව මෙන්ම හෘද සාක්ෂියට එකඟව සකස් කළ යුතු බව සඳහන්වන බවද වශයෙන් සාක්ෂිකරු සාක්ෂි දී ඇති අතර ඉල්ලුම්කරුගේ R 5 ප්‍රකාශය අනුව පෙනී යන්නේ මණ්ඩලීය මුදලින් ගෙවිය නොහැකි මුදලක් ඉල්ලුම්කරු විසින් දැන දැනම වවුචරයට ඇතුළත් කර ඇති බවද ප්‍රකාශ කර ඇත. R 5 ප්‍රකාශයෙහි ඉල්ලුම්කරු ප්‍රකාශ කර ඇත්තේ “මණ්ඩලීය පිළිවෙත් දන්නා නිලධාරියකු වන තමන් විසින් සිද්ධියට අදාළ වව්චරයෙහි වැය සහතික නොකළේ තමන්ට ඒ පිළිබඳව එකඟවිය නොහැකි නිසා බව” ප්‍රකාශ කර ඇති බවත් ඒ අනුව ඉල්ලුම්කරු මෙම ගෙවීම නිවැරදි නොවන බව දැන සිටි බව සාක්ෂිකරු පෙන්වා දී ඇත.

2019.12.04 වැනි දින ඉල්ලුම්කරුගෙන් නැවත ප්‍රශ්ණ විමසීමේදී ඉල්ලුම්කරුට චෝදනා පත්‍රයක් ලබාදීමේදී ඔහුට ආමන්ත්‍රණය කළ ආකාරය නිවැරදි නොවන බවට කරන ලද ප්‍රකාශය සම්බන්ධයෙන් සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත්තේ එවැනි දෝෂයක් තිබුණේ නම් චෝදනා පත්‍රය ලැබීමේදී, පිළිතුරු ලිවීමේදී, විනය විභාගයේදී, අභියාචනා විභාගයේදී, මේ සම්බන්ධයෙන් විරෝධතා දැක්වීමේ අයිතිය ඉල්ලුම්කරුට තිබුණ බවයි.

R 7 සහ R 8 ලේඛනය සකස් කිරීම සම්බන්ධයෙන් ඉල්ලුම්කරු අත්සන් කර ඇති බවත් කෙසේ වුවද R 8 ලේඛනයෙන් වගකීම් අභ්‍යන්තර ගිණුම් පරීක්ෂක සිරිල් රංජිත් පතිරණ අයට පැවරෙන බවත්, ඔහු මණ්ඩලීය මුදල් වංචා කර ඇති බව අනාවරණය වූ බවද නැවත ප්‍රශ්ණ විමසීමේදි සඳහන් කර ඇත. (පිටුව 7) තවද මෙම ඉල්ලුම්කරුට තිබෙන චෝදනාව එයට ආධාර අනුබල දීමක් සිදුව ඇති බවද සඳහන් කර ඇත. කෙසේ වුවද ප්‍රධාන අභ්‍යන්තර ගිණුම් පරීක්ෂකට දඬුවම් වශයෙන් ඔහුගේ කොන්ත්‍රාත්තුව අවසන් කිරීම සිදුකළ බවත් ඉල්ලුම්කරුට දඬුවම් වශයෙන් ඔහු සේවයෙන් පහකර අනතුරුව තනතුරෙන් ශ්‍රේණියෙන් පහත හෙළා නැවත රැකියාව ලබාදීමත් සිදුකර ඇති බව පෙන්වාදී ඇත. (පිටුව 9)

වග උත්තරකාර පාර්ශවයෙන් 2020.02.12 වැනි දින නව සාක්ෂිකරුවෙකු වශයෙන් විනය විභාග අංශයේ විභාග නිලධාරි ඕ. ජී. එන්. කේ. පෙරේරා යන අය කැඳවා ඇති අතර ලිපි ගොනුව බලා මූලික සාක්ෂි ලබාදීම සිදුකර ඇත. ඒ අනුව විනය විභාග නිලධාරීන්

සොයාගත් වාර්තාව අනුව ඉල්ලුම්කරුට විනය නියෝගයක් ලබාදී ඇති බවත් ඒ අනුව ඉල්ලුම්කරු වහාම ක්‍රියාත්මක වන පරිදි සේවයෙන් පහකර ඇති බවත් විනය නියෝගය R 16 ලෙස සලකුණු කර ඉදිරිපත් කරමින් සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත. කෙසේ වුවද ඉල්ලුම්කරු මේ සම්බන්ධයෙන් අභියාචනා කළ පසු මුල් දඬුවම ඉවත් කර V ශ්‍රේණියට පහත හෙලා එහි ආරම්භක වැටුප් තලයේ තබා 2013.11.01 සිට V ශ්‍රේණියේ නිලධාරී තනතුරේ පිහිටුවා ඇති බව ප්‍රකාශ කර ඇත. හරස් ප්‍රශ්න විමසීම තුළින් ඉල්ලුම්කරුට චෝදනා පත්‍ර නිකුත් කිරීමේදී ඔහුගේ තනතුර නිවැරදිව දක්වා නොතිබීම සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් ප්‍රශ්න කර ඇත. තවද විනය පරීක්ෂණයේදී විත්තිකරුගේ පාර්ශවයෙන් සාක්ෂි නොකැඳවා ලබාදී ඇති නියෝගය සාධාරණ නොවන බව සාක්ෂිකරු සිය සාක්ෂියේදී පිළිගෙන ඇත. මෙය විනය ව්‍යවස්ථාවේ 4.4 ඒ23 ලේඛනය අනුව විනය විභාගයේදී විත්ති පාර්ශවය වන ඉල්ලුම්කරුට අවස්ථාවක් නොදී විනය පරීක්ෂණය අනුව නියෝගයක් ලබාදීම මෙම පැමිණිල්ලේ ඉල්ලුම්කරුට අසාධාරණ බවට තව දුරටත් කරුණු දක්වා ඇත. තවද මෙම විනය විභාගයේදී විමර්ශනකරුගේ සාක්ෂි පමණක් සැලකිල්ලට ගෙන ඇති බවද ප්‍රකාශ කර ඇත. තවද ඉල්ලුම්කරුට විනය නියෝගය ලබාදීමේදී ආමන්ත්‍රණය කර ඇති තනතුර නිවැරදි නොවන බවටද සාක්ෂිකරු සාක්ෂි ලබාදී ඇත. මේ හැර විනය නියෝගය සභාපතිවරයා විසින් ලබාදිය යුතුව තිබුණද එය මානව සම්පත් නිලධාරි විසින් ලබාදීම නිවැරදි නොවන බවටද සාක්ෂිකරුගෙන් ප්‍රශ්න කර ඇති අතර සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත්තේ මානව සම්පත් නිලධාරි විසින් සිදුකර ඇත්තේ නියෝගය දැනුම්දීමක් පමණක් බවයි.

මේ හැර ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ විනය ව්‍යවස්ථාවේ A උපලේඛනයේ දක්වා ඇති වැරදිවලට අනුව ඉල්ලුම්කරු සිදුකර ඇති වරද උපලේඛනයේ සඳහන් නොවන බැවින් එය විනය ව්‍යවස්ථාවට අනුකූල නොවන බවට ඉල්ලුම්කාර පාර්ශවය විසින් හබකර ඇති අතර සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත්තේ විනය ව්‍යවස්ථාවේ සඳහන් වන්නේ බරපතල විෂමාචාරවලින් සමහරක් පමණක් බවත් එහි සඳහන් නොවන වැරදි බරපතල වැරදි ලෙස ගතහැකිද යන්න විනය ව්‍යවස්ථාවේ සඳහන් නොවන බවත්ය. (පිටු අංකඃ25) තවද විනය ව්‍යවස්ථාවේ 10 IX අනුව නියම කළ හැක්කේ වේතනයෙන් හෝ ශ්‍රේණියෙන් හෝ තත්වයෙන් පහත හෙළීම සිදුකළ යුතු වුවද ඉල්ලුම්කරුට එකී දඬුවම් තුනම නියම කිරීම ව්‍යවස්ථානුකූල නොවන බවට ඉල්ලුම්කාර පාර්ශවය විසින් හරස් ප්‍රශ්න විමසීමේදී හබකර ඇත. එහිදී සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත්තේ ඉහත කී පරිදි “හෝ” යනුවෙන් සඳහන් කර තිබීම නිසා එක් දඬුවමක් පමණක් ලබාදිය යුතු බැවින් ඉල්ලුම්කරුට දඬුවම් තුනක් ලබාදීම නිවැරදි නොවන බවයි. p407

2020.10.02 වැනි දින වැඩිදුර හරස් ප්‍රශ්න විමසීම සිදුවූ අතර එහිදී ඉල්ලුම්කරුට ලබාදී ඇති දඬුවම් ව්‍යවස්ථාවට අනුකූල නොවීම සම්බන්ධයෙන් වැඩිදුරටත් ප්‍රශ්න කර ඇත. එහිදී සාක්ෂිකරුගෙන් විමසා ඇත්තේ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ විනය ව්‍යවස්ථාවේ 10 IX වගන්තිය අනුව ඉල්ලුම්කරුට දඬුවම් තුනක් ලබාදීම නිවැරදිද යන්න ප්‍රශ්න කර ඇත. එහිදී සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත්තේ එකී ව්‍යවස්ථාවට අනුව එක දඬුවමක් පමණක් දිය යුතු බවයි. පී 418 ඒ අනුව සාක්ෂිකරුගේ ප්‍රකාශය තුළින්ම පෙනී යන්නේ එකම වරද සම්බන්ධයෙන් ඉල්ලුම්කරුට දඬුවම් තුනක් ලබාදී ඇති බවත් එය ව්‍යවස්ථාවට අනුකූල නොවන බවත්ය. තවද යම් පුද්ගලයෙකුගේ ස්ථාන මාරුකිරීමට අදාළ කරුණු විනය ව්‍යවස්ථාවේ 10.2.3 වගන්තියේ ඇති බවත් එහි සඳහන් පරිදි අකීකරු වීම, අධිකාරියට විරුද්ධ වීම, විනය ආරක්ෂා කර ගැනීමට සේවකයා රඳවා ගැනීමෙන් හානියක් සිදුවීම යන කරුණු හා ඒ සඳහා අදාළ කරගන්නා බවත් එලෙස ඉල්ලුම්කරු විසින් එවැනි වරදක් සිදුකර තිබේද යන්න සාක්ෂිකරුගෙන් විමසා ඇත. කෙසේ වුවද ඉල්ලුම්කරු වෙතින් එවැන්නක් සිදුවී ඇති බව විනය වාර්තාවේ කොතැනක හෝ සඳහන්ව නොමැති බව සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න විමසීමේදී ප්‍රකාශ කර ඇත. පී 420 සාක්ෂිකරුගේ මෙම සාක්ෂියෙන්ද පෙනී යන්නේ ඉල්ලුම්කරුට ස්ථාන මාරුවීමක් ලබාදීමද විනය වාර්තාවේ සඳහන් කරුණු වලට පටහැනිව සිදුකර ඇති බවයි.

තවද මුදල් වංචා කිරීමට අනුබල දුන්නා හෝ මුදල් වංචා කළා යන කාරණය සනාථ කිරීමට මුදල් ලද පුද්ගලයා වන හොටෙල් නිවහන ආයතනය හෝ සාක්ෂියට කැඳවා නොමැති බවද සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න විමසීමේදී අනාවරණය වී ඇත. මේ අනුව හුදෙක් පරීක්ෂණ නිලධාරියාගේ සාක්ෂි මත පමණක් විනය පරීක්ෂණය සිදුව ඇති බව පෙනේ. ඒ අනුව සියලු සාක්ෂි විමසා බලා සාධාරණ නිගමනයකට පැමිණ නොමැති බවද ඉහත සාක්ෂිකරුගේ සාක්ෂිය අනුව පැහැදිලි වේ.

<u>සාක්ෂි විශ්ලේෂණය සහ ප්‍රධානය ඉදිරිපත් කිරීම් ස්ථාවරය.ඃ</u>

1. ඉල්ලුම්කරු මූලික සාක්ෂි ලබාදීමේදී තමන්ට එල්ලවී ඇති චෝදනා සම්බන්ධයෙන් සාක්ෂි ලබාදී ඇත. ඒ අනුව තමන්ට ලැබී ඇති චෝදනා පත්‍රයේ අංක ඃ 1. චෝදනා වන මණ්ඩලීය පිළිවෙත් අනුව මිල ගණන් නොකැඳවා අභිමතය පරිදි විගණන සාකච්ඡාව සඳහා ''නිවහන සිලුක්ස්'' ආයතනය තෝරා ගැනීම තමන් පිළි නොගන්නා බව ප්‍රකාශ කර ඇත. ඔහු වැඩි දුරටත් ප්‍රකාශ කර ඇත්තේ එවැනි මිල ගනන් කැඳවීමේ පිළිවෙතක් මණ්ඩලයේ තිබුණේ ගබඩාව සඳහා භාණ්ඩ මිලදී ගැනීමේදී පමණක් බවත් සාකච්ඡාවන් සඳහා ආයතනක් වෙන්කර ගැනීමේදී එවැනි පිළිවෙතක් නොවූ බවත්ය. එවැනි පිළිවෙතක් තිබූ බවට චක්‍රලේඛනයක් හෝ තිබුනේ නම් අවම වශයෙන් විනය පරීක්ෂණයේ දී හෝ එය ඉදිරිපත් කළ යුතුව තිබූ බව ඉල්ලුම්කරු සිය මූලික සාක්ෂියේදී ප්‍රකාශ කර ඇත.

ප්‍රශ්නය ඃ මෙම මණ්ඩලයේ නීතිය අනුව මිලගණන් කැඳවීමේ පිළිවෙතක් තිබෙනවද?

උත්තරය ඃ ඔව් තිබෙනවා ගබඩා මිලදී ගැනීම් සම්බන්ධව පිලිවෙතක් ඇති මුත් විගණන සාකච්ඡා සඳහා මිල ගණන් කැඳවීමේ පිළිවෙතක් නැහැ.

ප්‍රශ්නය : මෙම චෝදනාව කරන විට විමර්ශණ නිලධාරියා ගෘහස්ත විභාගයේදී මිලගණන් කැඳවිය යුතුය යන තීරණයට ඇවිත් තිබෙනවා නම් ඊට අදාළ මාණ්ඩලීය චක්‍රලේඛ ඉදිරිපත් කළ යුතුද, නැද්ද?

උත්තරය : කළ යුතුයි.

මේ අනුව ඉල්ලුම්කරු විසින් ආයතනයක් වෙන්කරවා ගැනීමේදී මිල ගණන් කැඳවීය යුතුය යන වග උත්තරකාර පාර්ශවයේ ස්ථවරය ලිඛිත සාක්ෂි මගින් ඔප්පු කිරීමට වග උත්තරකාර පාර්ශවය අසමත්ව ඇත.

තවද තම අභිමතය මත නොව එකී ආයතනය ගැනීම ප්‍රධාන විගනන පරීක්ෂකගේ උපදෙස් මත සිදුවූවක් මෙන්ම ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සහකාර මුදල් කළමනාකාර සමග ගොස් ආයතනය වෙන්කරවා ගත් හෙයින් මෙහිදී අත්තනෝමතිකව ආයතනය තෝරාග ැනීමක් සිදු නොවූ බව ප්‍රකාශ කර ඇත. මේ අනුව එකී චෝදනාව ඉල්ලුම්කරු විසින් අභියෝගයට ලක්කර ඇත. මේ අනුව ඉල්ලුම්කරු ආයතනය විගණන රැස්වීම සඳහා අත්තනෝමතිකව තම අභිමතය පරිදි තෝරා ගත්තේය යන වග උත්තරකාර පාර්ශවයේ තර්කයද බැහැර වේ.

2. 9AC හි දෙවන චෝදනාව වන ''නිවහන ඩිලුක්ස්'' ආයතනය විගණන සාකච්ඡාව සඳහා පාවිච්චි කිරීමට අදාළ බිල්පත් සැකැසීම ඉල්ලුම්කරු විසින් සිදුකිරීමට ඉල්ලුම්කරු සෘජුව හෝ වක්‍රව දායක වූ බවට කරන චෝදනාව ඉල්ලුම්නරු විසින් ප්‍රතික්ෂේප කරමින් සාක්ෂි දී ඇත. තවද එකී බිල්බත ව්‍යාජ බිල්පතක් ලෙස සාක්ෂි මඟින් තහවුරුව නොමැති බවත්, එහි ගෙවීම් සඳහා අදාළ නිලධාරීන්ද අනුමැතිය ලබාදී ඇති හෙයින් ''ව්‍යාජ බිල්පතක්'' යන්නද අභියෝගයට ලක්කර ඇත. කෙසේ වුවද ඉල්ලුම්කරු විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත්තේ බිල්පත් සැකසීමට තමන් මැදිහත් නොවුවද ඊය අදාළ වැයපත තමන් සකස්කළ බවයි. එකී බිල්පත A 12 ලෙස ලකුණු කර සාක්ෂි දී ඇති අතර එකී බිල්පත වෙනත් අයකු විසින් පිළියෙළ කළ බවත් වැයපත ලිවීමේ වගකීම තමන් භාර ගන්නා බවටත් ඉල්ලුම්කරු විසින් සාක්ෂි දී ඇත. අංක : 1068 බිල් පත්‍රය ඩිපෝ කළමනාකරුට ලාබාදී ඇති බවටත් එයට සම්මන්ත්‍රණයට සහභාගී වූවන්ගේ නාම ලේඛනය අමුණා ඇති අතර එය A 13 ලෙස ලකුණුකර සිටී. එකී බිල්පත ව්‍යාජ බිල්පතක් බවට විමර්ෂණ නිලධාරියා කියා සිටියද වෙනත් කිසිවකු හෝ එලෙස ව්‍යාජ බිල්පතක් බවට සාක්ෂි දී නොමැති බවද සාක්ෂිකරු විසින් ප්‍රකාශ කර සිටී. ඒ අනුව තමන් නිවහන ඩිලුක්ස් ආයතනයෙන් නිකුත් කරණා ලද බිල්පත සැකසීමට සෘජුව හෝ වක්‍රව දායකව නොමැති බවද ප්‍රකාශ කර ඇත. කෙසේ වුවද ඉල්ලුම්කරුගේ මුල් ප්‍රකාශය පරිදි ඉල්ලුම්කරු බිල්පතට අදාළ වවුචරය සැකසීමට දයක වීම මත මෙම ගෙවීමට අදාළව ඉල්ලම්කරුගේ සෘජු සම්බන්ධයක් නොවුවද වැයපත සකස් කිරීම තුළින් මෙම විගණන සාකච්ඡාවට අදාළ ගෙවීම් සම්බන්ධයෙන් ඉල්ලුම්කරුගේ යම් සම්බන්ධතාවයක් ඇතිව ඇති බව පෙනේ. එබැවින් දෙවන චෝදනාවට අදාළ කරුණ සම්බන්ධයෙන් සම්පූර්ණයෙන් තමන් නිදහස් බව ප්‍රකාශ කිරීමට ඉල්ලුම්කරුට අයිතියක් නොමැත. එයට හේතුව වන්නේ විගණන සාකච්ඡාවට අදාළ වැයපත සකස්කිරීමට ඉල්ලුම්කරු යම් ආකාරයකට සම්බන්ධ වීමයි.

3. තවද ඉල්ලුම්කරුගේ මූලික සාක්ෂියේදීද අනාවරණය වන්නේ ඉල්ලුම්කරු විසින් වැයපත සකස් කිරීමේදී ප්‍රධාන විගණන නිලධාරි සිරිල් රංජිත් පතිරණ විසින් නිවහන ඩිලුක්ස් ආයතනයේ නවාතැන් ගැනීම මත පැන නැගුනු වියදම්ද තමන් විසින් වැයපතට ඇතුළත් කළ බවයි. ''ආහාර සහ නවාතැන්'' යනුවෙන් එය ඔහු විසින් සටහන් කළ බවද පිළිගෙන ඇත. තම ආයතන ප්‍රධානියා විසින් සිය නවාතැන් ගැනීම සම්බන්ධයෙන් දරන ලද වියදම් එකී තැනැත්තාගේ පෞද්ගලික වියදම් බව දැන දැනම එලෙස ආයතනයේ විගණන සාකච්ඡාව සඳහා වියදම් තුළට ඇතුලත් කිරීමට හේතුව ලෙස ඉල්ලුම්කරු විසින් හරස් ප්‍රශ්නවලට මුහුණ දෙමින් ප්‍රකාශ කර ඇත්තේ එකී තම ඉහල නිලධාරියාගේ උපදෙස් මත මෙම වියදම වැයපතට ඇතුළත් කර ඇති බවයි.

ප්‍රශ්නය : තමා ප්‍රකාශ කළානේ මෙම බිල්පතේ නවාතැන් ඇතළත් කරන්න කීවේ ඉහල නිලධාරියා කියලා ?

උත්තරය : මාගේ ඉහල නිලධාරියාගෙන් මා අසා සිටියා මෙම ආයතනය වෙන්නරවා ගත්තේ අහාරපාන සහ ශාලා පහසුකම් සඳහා පමණයි. නවාතැන් පහසුකම් නැහැ කියලා.

ප්‍රශ්නය : එතුමා කුමක්ද කිව්වේ.

උත්තරය : වැයපත ලියන්න කීවා.

ප්‍රශ්නය : වැයපත ලියන්න කීවේ කොහොමද ?

උත්තරය : වැයපත ලියන්න කීවා නවාතැන් සහ සංග්‍රහ වියදම් කියලා.

ප්‍රශ්නය : තමා කළේ වැරැද්දක් නේද ?

උත්තරය : ඔව්

මේ අනුව ඉල්ලුම්කරු විසින් තමන් විසින් සකස්කරන ලද වැයපතට ''නවාතැන් වියදම්'' ඇතුළත් කිරීම වැරද්දක් බව දැන දැනම එය සිදුකර ඇති බව සැක්ෂියෙන් පැහැදිලිවේ. තවද එකී ක්‍රියාව වැරද්දක් බව ඔහුගෙන් හරස් ප්‍රශ්න විමසීමේදී පිළිගෙන ඇත. ඒ අනුව තෙවැනි චෝදනාව වන මණ්ඩලීය මුදල් වංචා කිරීමට ආධාර අනුබල දීම යන චෝදනාවට මෙම ක්‍රියාව මත ඉල්ලුම්කරුට වගකීම පැවරේ. තවද ඉල්ලුම්කරුද විගණන අංශයේ සේවකයකු වශයෙන් මෙවැනි ක්‍රියාවකදී සැලකිලිමත්ව කටයුතු කළේ නම් ආයතනයට සිදුවූ මූල්‍යමය අලාභය මඟ හරවා ගැනීමට ඉඩ තිබිණි.

4. තමන් විසින් වගකීම් අනලස්ව විශ්වාසදායකව සපුරාලීම හෝ ඉටුකිරීම හෝ ඉටුකිරීම පැහැරහැරීම යන චෝදනාව ඉල්ලුම්කරුට විරුද්ධව ඇති හතරවැනි චෝදනාව වේ. ඉහතින්ද සඳහන් කළ පරිදි නිවැරදි නොවන දත්ත දැන දැනම වැයපතට ඇතුළත් කිරීමෙන් ඉල්ලුම්කරු ආයතනය කෙරේ ඇති විශ්වාසය කඩකර ඇති බව පෙනේ. එමෙන්ම ඉල්ලුම්කරුගෙන් හරස් ප්‍රශ්න විමසීමේදී ද බිල්පත එනම් R 7 ට අනුව ආහාර ලබාදුන් සංඛ්‍යාව සහ A 17 විගණන සාකච්ඡාවට සහභාගී වූ සංඛ්‍යාව අතරද පරස්පර විරෝධිතාවයක් ඇති බව ඉල්ලුම්කරු විසින් පිළිගෙන ඇත.

ප්‍රශ්නය : R 7 ලේඛනයේ සඳහන්වන පුද්ගලයින් ගණන සහ A 13 ලේඛනයේ අත්සන් ගණනයි සමානද ?

උත්තරය : සමාන නැහැ.

තවද ඉල්ලුම්කරු සකස් කළ වැයපත සකස් කිරීමද ඉල්ලුම්කරු විසින් කිසිදු සැලකිල්ලක් නොමැතිව සිදු කර ඇති බවද ඉල්ලුම්කරුම පිළිගෙන ඇත.

ප්‍රශ්නය : මෙම වැයපත කිසිදු සැලකිල්ලකින් තොරව සකස්කර තිබෙන්නේ කියලා යෝජනා කරනවා.

පිළිතුර : ඔව්.

මේ අනුව එකී විෂමතාවය මත එකී ගනුදෙනුවෙහි විනිවිදභාවයක් නොමැති බව පැහැදිලිවේ. තවද බිල්පත් අංකය 1068 වුවද තමන් විසින් එය 1065 ලෙස වැයපතෙහි ඇතුළත්කර ඇති බවඉල්ලුම්කරු විසින්ම පිළිගෙන ඇත. ඉල්ලුම්කරුගෙන් හරස් ප්‍රශ්න විමසීමේදී

ප්‍රශ්නය : මෙම වැයපත කිසිදු සැලකිල්ලකින් තොරව සකස්කර ඇති බව යෝජනා කරනවා ?

උත්තරය : ඔව් යනුවෙන් ඉල්ලුම්කරු පිළිතුරු ලබාදී ඇත.

මේ අනුව ඉල්ලුම්කරු විසින් කරනු ලබන ක්‍රියවන් තුළින්ම එල්ලවී ඇති හතරවැනි චෝදනාව වන වගකීම් අනලස්ව විශ්වාසදායකව සපුරාලීම හෝ ඉටුකිරීම පැහැරහැරීම යන චෝදනාව තහවුරු වී ඇත.

5. ඉහතකී කරුණු සියල්ල සලකා බැලීමේදී සහ ඉල්ලුම්කරුගේ තනතුර අනුව ඔවු විගණන නිලධාරියකු බැවින්ද, ඉහතකී ගෙවීමට අදාළ වැරදි සිදුකිරීම තුළින් ඔහුගේ තනතුරට ගැලපෙන පරිදි නිවැරදි ක්‍රියා පිළිවෙතක් අනුගමනය කිරීමට ඔහු අපොහොසත්ව ඇති බවද පෙනේ.

6. කෙසේ වුවද ඉල්ලුම්කරු මෙම පැමිණිල්ල ඉදිරිපත්කර ඇත්තේ ඔහුට විරුද්ධව පැවති විනය පරීක්ෂණයේදී ලබාදී ඇති විනය නියෝගය / අභියාචනා නියෝගය මගින් අසාධාරණයක් සිදුව තිබේද යන්න සහ එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ.

(1). තමන්ට ඉදිරිපත්කර ඇති චෝදනා පත්‍රය ඉල්ලුම්කරු විසින් A 9 ලෙස ඉදිරිපත්කර ඇති අතර එම චෝදනාපත්‍රයේ තමන්ගේ තනතුර V ශ්‍රේණිය ලෙසත් සේවා ස්ථානය නුවරඑලිය ලෙස සඳහන්කර තිබීම නිවැරදි නොවන බව ඉල්ලුම්කරු සිය සාක්ෂියේදී ප්‍රකාශ කර ඇත. මේ සම්බන්ධයෙන් ඉල්ලුම්කරුගෙන් හරස් ප්‍රශ්න විමසීමේදී තහවුරු වී ඇත්තේ ඉල්ලුම්කරු විසින් අදාළ පරීක්ෂණයේදී තමන් සිටි තනතුර දක්වෙන හැඳුනුම්පත ඉදිරිපත් නොකිරීමේ හේතුව මත මෙම වැරැද්ද සිදුව ඇති බවත් ඔහු තම සේවයට අදාළ හැඳුනුම්පත ඉදිරිපත් නොකර වෙනත් සේවා තත්වයකදී භාවිතා කළ හැඳුනුම්පතක් ඉදිරිපත් කිරීමෙන් මෙම වරද සිදුව ඇති බවයි. කෙසේ වුවද ඉල්ලුම්කරුට අවශ්‍යතාවයක් තිබුණේ නම් පරීක්ෂණ අවස්ථාවේදී මෙම වැරැද්ද නිවැරදි කිරීමට අවස්ථාව තිබූ බව ප්‍රකාශ කර ඇත. තවද තමන් විසින් ම මුල් අවස්ථාවේ R 5 ලෙස සලකුණුකර ඇති ප්‍රකාශය දීමේදී වැරදි ප්‍රකාශයක් දීම මත මෙම වැරැද්ද සිදුව ඇති බව ඉල්ලුම්කරු විසින් ම හරස් ප්‍රශ්න විමසීමේදී පිළිගෙන ඇත.
(2019.01.09 හරස් ප්‍රශ්න විමසීම පිටු අංක:20)

ප්‍රශ්නය ඃ මෙම ප්‍රකාශය ගන්නා විට තමා හිටියේ මහනුවර ප්‍රාදේශිකයේ. තමා මෙම ප්‍රකාශය කර තියෙන්නේ නුවරඑළිය ප්‍රාදේශිකයේ සේවය කරන නිලධාරියා ලෙස තමා හඳුන්වා දී තිබෙන්නේ මෙම ප්‍රකාශයෙන් ?

පිළිතුර ඃ ඔව්.

මේ අනුව තමාගේ නිවරදි තොරතුරු ලබාදීමක් ඉල්ලුම්කරු විසින් සිදුකර නොමැති බව ඉල්ලුම්කරු විසින්ම පිළිගෙන ඇත.

කෙසේ වුව ද ඉල්ලුම්කරු විසින් හෝ වග උත්තරකරු විසින් මෙය නිවරදි කිරීමක් කර නොමැති බව සාක්ෂි අනුව පැහැදිළි වේ. කෙසේ වුවද හුදෙක් මෙය විධිමය වැරද්දක් මිස විනය පරීක්ෂණයේ වරදක් ලෙස පෙන්වාදිය නොහැකි බව නිගමනය කරමි.

(11). මේ හැර විනය පරීක්ෂණයේ දී ඉල්ලුම්කරුට අසාධාරණයක් සිදුව තිබේ ද යන්න විමසා බැලිය යුතු ය.

ඉල්ලුම්කරුට අදාල පැමිණිල්ල සම්බන්ධයෙන් විමර්ශනය සිදුකර ඇත්තේ 2011 වසරේදී ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ විශේෂ විමර්ශන ඒකකයේ විශේෂ විමර්ශන කළමනාකරු ලෙස සේවය කරනු ලැබූ දැනට ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ පළමු ශ්‍රේණියේ නිලධාරියකු වන ඉන්දික චන්දිමාල් ද සිල්වා විසින් බව (වග උත්තරකරු වෙනුවෙන්) ඔහුගෙන් සාක්ෂි විමසීමේදී අනාවරණය වී ඇත. ඔහුගේ සාක්ෂියට අනුව ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ සභාපතිවරයා වෙත එම මණ්ඩලයේ ප්‍රධාන විගණන නිලධාරී සිරිල් රංජිත් පතිරණ යන අයට විරුද්ධව ලැබී ඇති පැමිණිල්ලක් විභාග කිරීමේදී අනාවරණය වූ කරුණු මත ඊට අනුබද්ධිතව ඉල්ලුම්කරුගේ විෂමාචාර ක්‍රියාවක් ලෙස මෙම ඉල්ලුම්කරු සම්බන්ධයෙන් ද විමර්ශනයක් කිරීමට සිදුවූ බව ඔහුගේ සාක්ෂියේදී වැඩිදුරටත් හෙළිදරව් වී ඇත.

කෙසේ වුව ද 2019.09.18 දින හරස් ප්‍රශ්ණ විමසීමේ දී සාක්ෂිකරුගෙන් සාක්ෂි විමසීමේ දී සාක්ෂිකරු වැඩි දුරටත් ප්‍රකාශ කර ඇත්තේ තම විමර්ශනයට අනුව සිරිල් රන්ජිත් පතිරණ යන අය සම්බන්ධයෙන් ගෘහස්ත පරීක්ෂණයක් නොකොට කොන්ත්‍රාත් සේවය අවසන් කළ බවත් ය.

ප්‍රශ්නය ඃ ඔබගේ විමර්ශනයේ දී සිරිල් රන්ජිත් පතිරණ ප්‍රධාන අභ්‍යන්තර ගිණුම් පරීක්ෂක චෝදනා ලබනවද.?

උත්තරය ඃ ඔව්.

ප්‍රශ්නය ඃ ඔහුට එරෙහි R 12 පදනම් කරගෙන තවත් ගෘහස්ත පරීක්ෂණයක් පවත්වා තිබෙනව ද ?

උත්තරය : නැහැ. එයට හේතුව ඔහු කොන්ත්‍රාත් සේවකයෙක් නිසා කොන්ත්‍රාත්තුව අවසන් කළා.

වැඩිදුරටත් හරස් ප්‍රශ්නවලට භාජනය වෙමින් පවසා ඇත්තේ ඔහුට පොදු නීතිය යටතේ හෝ දඬුවම් පැමිණ වූයේද යන්න තමා නොදන්නා බවත් ය. (සාක්ෂි පිටු අංක 17) මේ අනුව එම විෂමාචාරයට සම්බන්ධ ප්‍රධාන චූදිතයා වන ප්‍රධාන විගණන නිලධාරිට සිය කොන්ත්‍රාත් කාලය අවසන් වීමෙන් පසු සේවය අවසන් කිරීමක් කර ඇතැයි පැවසුව ද එහි දී සිදුව ඇත්තේ සාමාන්‍ය නීතියට අනුව කොන්ත්‍රාත් ගිවිසුම අවසන් වීම මිස දඬුවමක් දීමක් නොවන බව පැහැදිළි වේ. කොන්ත්‍රාත් කාලය අවසන් වීමෙන් පසු සේවය අවසන් කිරීම සහ කොන්ත්‍රාත් ගිවිසුම අලුත් නොකිරීම දැඩි දඬුවමක් ලෙස පිළිගත නොහැක. කෙසේ වුවද විෂමාචාරය සම්බන්ධයෙන් අනුබල දුන්නේ යයි සැලකෙන ඉල්ලුම්කරුට සේවයෙන් ඉවත් කිරීම පසුව අභියාචනා කිරීමෙන් අනතුරුව නැවත සේවයේ පිහිටවුව ද තත්ත්වයෙන් ශ්‍රේණියෙන් සහ වේතනයෙන් පහත හෙළීම ස්ථාන මාරුකිරීම වැනි දඬුවම් කිහිපයක් පමුණුවා ඇත. මේ අනුව විනය පරීක්ෂණයේ දී ද ප්‍රධාන චූදිත නිදහස් කර ඇති අතර ඔහු නිසා ආයතනයට ඇති වූ අලාභය පවා අය නොකර ගෘහස්ත පරීක්ෂණයෙන් පවා නිදහස් කර ඇත. මේ අනුව ඉහත කී පරිදි එකම සිද්ධියට අදාළ දෙදෙනාට දෙයාකාරයකට කටයුතු කිරීම යුක්ති සහගත නොවන බව නිගමනය කරමි.

(III) මේ හැර මෙම සිද්ධියට අදාළ බිල්පත සැකසූ ආයතනයෙන් විමර්ශනයේ දී තොරතුරු ලබා ගත්තේ දැයි විමසීමේ දී එසේ නොකළ බව සාක්ෂිකරු පවසා ඇත.

ප්‍රශ්නය : එසේනම් එම ආයතනයෙන් බිල්පත සම්බන්ධයෙන් ප්‍රකාශයක් හෝ සටහනක් ලබාගත්ත ද?

උත්තරය : ඔවුන් එසේ ලබාදීම ප්‍රතික්ෂේප කළා. (2019.10.10 සාක්ෂි සටහන් පිටු අංක 14)

මේ අනුව විෂමාචාරයට සම්බන්ධ තෙවන පාර්ශවයෙන් තොරතුරු ලබා ගැනීමට ද විමර්ශන නිලධාරියා අසමත්ව ඇත. මේ අනුව සිද්ධියට අදාළ සියලු පාර්ශවයන්ගෙන් තොරතුරු හෝ සාක්ෂි ලබා නොගැනීමෙන් ද ඉල්ලුම්කරුට යම් අසාධාරණයක් සිදුව ඇති

බව නිගමනය කරමි.

(IV) මේ හැර විනය විභාගයේ දී තමන් හැර වෙනත් සාක්ෂිකරුවන් විනය විභාගය සඳහා කැඳවා නොමැති බවට ද සාක්ෂිකරු සාක්ෂි ලබාදී ඇති අතර එම වගකීම විනය විභාග නිලධාරියාට පැවරෙන බව ද වැඩි දුරටත් පවසා ඇත.

ප්‍රශ්නය : විනය විභාග සටහන්වලට ඔබ හැර වෙනත් කවරෙකු හෝ සාක්ෂි සඳහා කැඳවා තිබෙනව ද?

උත්තරය : කැඳවලා නැහැ. වගකීම පැවරෙන්නේ විනය විභාග නිලධාරියාට වශයෙන් ප්‍රකාශ කර ඇත. මේ අනුව විනය විභාගයේ දී ද අදාළ සියලු සාක්ෂි නොකැඳවීමෙන් ඉල්ලුම්කරුට අගතියක් ඇතිව ඇති බව පෙනේ. තව ද විනය පරීක්ෂණයේ දී විත්තිකරුගේ පාර්ශවයෙන් සාක්ෂි නොකැඳවා ලබා දී ඇති නියෝගය විනය ව්‍යවස්ථාවේ 4.4 වගන්තියට අනුකූල නොවන බව සහ සාධාරණ නොවන බව ද වග උත්තරකාර පාර්ශවයේ සාක්ෂිකරුවකුවන විනය විභාග නිලධාරි ඕ. ජී. එන්. කේ. පෙරේරා යන අයගෙන් හරස් ප්‍රශ්න විමසීමේ දී පිළිගෙන ඇත. මේ අනුව විනය විභාගයේ දී ඉල්ලුම්කරුට අසාධාරණයක් වූ බව වග උත්තරකාර පාර්ශවයේ සාක්ෂි තුළින් ම තහවුරු වී ඇත.

(V) විනය ව්‍යවස්ථාවේ 10 IX අනුව නියම කළ හැක්කේ වේතනයෙන් හෝ ශ්‍රේණියෙන් හෝ තත්ත්වයෙන් පහත හෙළීම යන දඬුවම් තුනෙන් එකක් පමණක් බව ඕ. එන්. ජී. කේ. පෙරේරා යන වග උත්තරකාර පාර්ශවයේ සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත. එසේ වුවද ඉල්ලුම්කරුට එකී දඬුවම් සියල්ල හෝ කිහිපයක් නියම කිරීම එකී ව්‍යවස්ථාවට පටහැනි බව/බවට ඉල්ලුම්කාර පාර්ශවය විසින් හරස් ප්‍රශ්න විමසීමේ දී හබකර ඇත.

ප්‍රශ්නය : 10 IX හි වේතනයෙන් හෝ ශ්‍රේණියෙන් හෝ තත්ත්වයෙන් පහත හෙළීම ලෙස නේද සඳහන් වන්නේ ?

උත්තරය : ඔව්

ප්‍රශ්නය : අභියාචනා නියෝගය අනුව වේතනයෙන් පහත හෙලා තිබෙනවා ද?

උත්තරය : ඔව්

ප්‍රශ්නය : ශ්‍රේණියෙන් පහත හෙලා තිබෙනවා ද?

උත්තරය : ඔව්
මේ අනුව ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන අභිබවා ඉල්ලුම්කරුට එකකට වැඩි දඬුවම් ප්‍රමාණයක් නියම කර ඇති බව වග උත්තරකරුගේ සාක්ෂිය මතම තහවුරු වේ.

ඉහත කී කරුණු අනුව විනය විභාගයේ දී මෙන්ම දඬුවම් නියම කිරීමේ දී ද ඉල්ලුම්කරුට යම් අසාධාරණයක් සිදුව ඇති බව පෙනේ.

**ප්‍රදානය**

මෙම නඩුවේ ඉල්ලුම්කාර පාර්ශවය සහ වගඋත්තරකාර පාර්ශවයේ පළමු සහ දෙවන ප්‍රකාශයන් ද දිවුරුම් ප්‍රකාශ සහ ඉදිරිපත් කර ඇති ලිඛිත සහ වාචික සාක්ෂි මෙන්ම ලිඛිත දේශන ද සැලකිල්ලට ගත් අතර ඒ අනුව :

1. සාකච්ඡාව සඳහා මිල ගණන් කැඳවීමක් නොකර අභිමතය මත ආයතනයක් තෝරාගැනීම සම්බන්ධයෙන් ඉල්ලුම්කරුට චෝදනාවක් එල්ල වී ඇති අතර වගඋත්තරකාර පාර්ශවය විසින් එලෙස මිල ගණන් කැඳවීමේ පිළිවෙතක් තිබූ බව ඔප්පු කිරීමට අසමත්ව ඇති හෙයින් එම චෝදනාව තහවුරු කිරීමට වගඋත්තරකාර පාර්ශවය අසමත්ව ඇති බව නිගමනය කරමි.

2. විගණන සාකච්ඡාවට අදාළ වැයපත සැකසීමේ දී තම අංශ ප්‍රධානියාගේ උපදෙස් පරිදි ඔහුගේ පෞද්ගලික වියදම්

වැයපතට ඇතුළත් කිරීමට ඉල්ලුම්කරු කටයුතු කිරීමෙන් විගණන නිලධාරියෙකු වශයෙන් තම තනතුරට නොගැලපෙන ලෙස කටයුතු කිරීම, හෘද සාක්ෂියට එකඟව කටයුතු නොකිරීම සහ විනිවිද භාවයකින් යුතුව වැයපත සකස් නොකිරීම යන හේතු මත ඉල්ලුම්කරු විෂමාචාර ක්‍රියාවක් සිදු කර ඇති බවත් එමගින් ආයතනයට මූල්‍ය පාඩුවක් සිදුව ඇති අතර ඒ අනුව මෙම ගණුදෙනුව සම්බන්ධයෙන් ඉල්ලුම්කරු ද යම් වගකීමකට යටත්වන බව නිගමනය කරමි.

3. මීළඟට වගඋත්තරකාර පාර්ශවය විසින් ඉල්ලුම්කරුගේ මෙම විෂමාචාර ක්‍රියාවන් සම්බන්ධයෙන් විමර්ශනය සහ විනය පරීක්ෂණය කිරීමේ දී ඉල්ලුම්කරුට යම් අසාධාරණයක් සිදුවී ද යන්න සැලකිල්ලට ගත යුතුය.

ඉහතින් සඳහන් කළ පරිදි වරද සිදුකළ ප්‍රධාන විගණන නිලධාරි සම්බන්ධයෙන් ගෘහස්ත පරීක්ෂණයක් නොපැවැත්වීම සහ නිසි දඬුවම් නොදීම, සහ ඔහු විසින් වැය කළ පෞද්ගලික වියදම අයකර ගැනීමට විනය පරීක්ෂණයේ දී හෝ පොදු නීතිය මගින් කටයුතු කර නොතිබීම, සිද්ධියට අදාළ ආයතන, බිල්පත සැකසූ පුද්ගලයන් සහ ගෙවීම් සඳහා අනුමැතිය ලබාදුන් අය ආදී සෙසු සාක්ෂි නොකැඳවා විමර්ශන නිලධාරි පමණක් සාක්ෂි සඳහා කැඳවීම යන හේතු මත විනය පරීක්ෂණය විධිමත්ව පවත්වා නොමැති බවත්, ඒ අනුව ඉල්ලුම්කරුට අගතියක් සිදුව ඇති බව නිගමනය කරමි. තව ද විනය විභාගයේ දී සියලු සාක්ෂි නොකැඳවීම ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ ව්‍යවස්ථාවේ 4.4 වගන්තියට පටහැනි වේ. ඒ අනුව ද විනය විභාගය විධිමත් නොවන බව වැඩි දුරටත් තහවුරු වේ.

මේ හැර විනය ව්‍යවස්ථාවේ 101X ඡේදය යටතේ දඬුවම් නියම කිරීමේ දී නියම කළ හැක්කේ වේතනයෙන් හෝ ශ්‍රේණියෙන් හෝ තත්ත්වයෙන් පහත හෙළීම යන දඬුවම් තුනෙන් එකක් පමණක් වුවද එකී ඡේදයේ ප්‍රතිපාදන අනුගමනය නොකොට දඬුවම් කිහිපයක් නියම කිරීමෙන් ද ඉල්ලුම්කරුට අසාධාරණයක් සිදුව ඇති බව නිගමනය කරමි.

ඉහත කී කරුණු සියල්ල සලකා බැලීමේ දී ඉල්ලුම්කරුට ලබා දී ඇති නියෝගය යුක්ති සහගත සහ සාධාරණ නොවන බව තීරණය කරන අතර එකී දෝෂ සහගත තීරණය මත පිහිටා ඉල්ලුම්කරුගේ ශ්‍රේණිය පහත හෙළීම සහ ඊට අනුරූපව වේතනය අඩුකිරීම සාධාරණ නොවන බව තීරණය කරමි.

1. ඒ අනුව සාක්ෂි විමසීමේ දී දෙපාර්ශවය විසින් සලකා බලා 17B ලෙස සලකුණු කර ඇති ලේඛනය අනුව විත්තිකරු විසින් ඉල්ලා ඇති හිඟ වැටුප් දීමනාව වන රුපියල් 274802.77ක මුදලින් 70%ක කොටස පමණක් ඉල්ලුම්කරුට ගෙවීම පිණිස මහනුවර උතුර දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ තැන්පත් කිරීමට වගඋත්තරකරුට නියෝග කරමි.

2. ඉතිරි 30%ක ප්‍රමාණය විත්තිකරු විසින් සිදුකර ඇති විෂමාචාරය සම්බන්ධයෙන් ආයතනයට සිදුවූ මූල්‍යමය පාඩුව වශයෙන් සලකා කටයුතු කිරීමට නියෝග කරමි.

3. මෙම ප්‍රධානය *ගැසට්* පත්‍රයේ පළ වී මාස 02ක් ඇතුළත ක්‍රියාත්මක විය යුතුය. ඉහත කී හිඟ වැටුප් සහ දීමනා මුදල ඉල්ලුම්කරුට ගෙවීම පිණිස මහනුවර උතුර දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ තැන්පත් කළ යුතුය.

4. මෙම නියෝගය යුක්ති සහගත සහ සාධාරණවූත් තීරණයක් බව ප්‍රකාශ කරමි.

**එච්. එම්. අනුලාවතී,**
බේරුම්කරු.

2022 මාර්තු මස 27 වැනි දින.

EOG 07 - 0111

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.